**2021 ඔක්තෝම්බර් මස 22 වන දින පැවති**

**හතළිස් දෙවන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2021.10.22**
**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**
**වේලාව :- පෙ.ව 10.00**
**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **10.** ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | (එ.ජා.ප) |
| **11.** ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **12.** ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **13.** ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **14.** ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | |
|---|---|---|
| **15.** ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **16.** ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **17.** ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **18.** ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **19.** ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **20.** ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| **21.** ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

**නිළධාරීන්:-**

**01.** ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා
**02.** විෂය භාර කළමණාකරන සේවා නිළධාරී අයි.ජී.සී.නයෝමී වීරකෝන් මිය

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**2021.09.22 මහ සභා කෙටුම්පත් වාර්ථාව**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021.09.22 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතින්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2021.09.22 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.කේ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය 2021.09.22 දින පැවති මහ සභාවේ කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

**සංශෝදන**

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා 2021.08.21 වන දින පැවති සභා වාර්තාවේ සිදු කල සංශෝධන තුල ලෝකයේ සිටි ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු වන බර්ඩල් රෙස්ට් විසින් සිදු කල ප්‍රකාශයක් ඉදිරිපත් කලත් එය සටහන් කර නොමැති බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී. යන ප්‍රකාශය තුල එය ලෝකයේ සිටි ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු වන **බර්ටෝල් බ්‍රෙස්ට්** විසින් සිදු කල ප්‍රකාශයක් ලෙස සංශෝධනය විය යුතු බව සඳහන් කරමින් අදාල ශ්‍රේෂ්ඨ පුද්ගලයා සම්බන්ධයෙන් වන විස්තරයක් සභා ගත කරන ලදී.

තවද, 2021.08.22 මහ සභාවේදී **"පාන් පිටි කනවාට වඩා කුරක්කන් පිටි කෑම හොඳයි යන්න සඳහන් කළත්, කුරක්කන් පිටි ආහාරයට ගන්නේ කෙසේද යන්න දන්නේ නැතිනම් එයින් පළක් නොවන්නා සේම"** යනුවෙන් ලෙසට තමන් විසින් සිදු කල ප්‍රකාශය **"පාම් පිටි කනවාට වඩා තිරිඟු පිටි කෑම හොඳයි යන්න සඳහන් කළත්, තිරිඟු පිටි ආහාරයට ගන්නේ කෙසේද යන්න දන්නේ නැතිනම් එයින් පලක් නොවන්නා සේම"** ලෙසට සඳහන් කර ඇති බැවින් එය සංශෝධනය කිරීමට කටයුතු කරන ලෙසත් එසේ සඳහන් කිරිම ඉතාම කණගාටුවෙන් යුතුව හෙලා දකින බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා ගරු සභාපතිතුමා විසින් කාබණික පොහොර නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධ නොවූවත්, ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා විරුද්ධ බවට සඳහන් කර ඇතත්, තමන් ඒ අවස්ථාවේදී , ඩොලරයේ වටිනාකම අඩු වීම,1950 ජනතාව මිය යන හේතුවට පිළිතුරක් ලෙස දෙමහුම් ආහාර නිෂ්පාදනය, වැනි හේතු දැක්වූ බවත්, එලෙස කරුණු පැහැදිළිව නොදැක්වීම තුල වාර්ථාවේ හරයක් නොමැති බවක් දක්නට ලැබෙන බව සඳහන් කරන ලදී.

ඒ අනුව 2021.09.22 වන දින පැවති මහ සභා කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය**

**01. නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා, ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය, ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා , ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී.එම්.එන් සුභාෂිණි බංඩාර මැතිනිය, ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණි බංඩාර මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් ලිපි මහ සභාවට නිවේදනය කරන ලදී.

**02. කි.මී 100,000 ක් කාපට් කිරීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක වූ කි.මී 100,000 කාපට් කිරීම ව්‍යාපෘතිය යටතේ සෑම ප්‍රාදේශීය සභාවකටම මාර්ග සංවර්ධනය කර ගැනීමට අවස්ථාව හිමි වූ සේම මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පහත සඳහන් මාර්ග 10 ක් සංවර්ධනය කිරීම සඳහා මේ වන විට අනුමැතිය හිමි වී ඇති බවත්, එය සිට්රින්ග් කන්ස්ට්‍රක්ෂන් යන පෞද්ගලික ආයතනය මගින් ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සිදු කරන බවද නිවේදනය කරන ලදී.

01. ඇඳගල පන්සල පාර කි.මී 1 හා මීටර් 550 ක් කාපට් කිරීම
02. සංඝමිත්තා මාවත මීටර් 700 කාපට් කිරීම
03. විජය මාවත මීටර් 740 ක් කාපට් කිරීම
04. සමෘද්ධි මාවත මීටර් 760 ක් කාපට් කිරීම
05. කළුවිල සේන විදුහල් මාවත මීටර් 825 ක් කාපට් කිරීම
06. ගෙවල් 20 පාර මීටර් 470 ක් කාපට් කිරීම
07. සඳගම මාවත මීටර් 560 ක් කාපට් කිරීම
08. 4 ඇල පාර මීටර් 900 ක් කාපට් කිරීම
09. සූරියගහ මාවත මීටර් 780 ක් කාපට් කිරීම.
10. කිරි කඩය අසල මාර්ගය මීටර් 1800 කාපට් කිරීම.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත.**

**ආ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත.**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති, බල ප්‍රදේශය තුල ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය ශක්තිමත් කිරීම සඳහා වන යෝජනාව**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා විසින් බල ප්‍රදේශය තුල ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය ශක්තිමත් කිරීම වෙනුවෙන් නීත්‍යානුකූලව යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කරමින් යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා එතුමා වෙත අවස්ථාව ලබා දෙන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා යෝජනාව අද දින සාකච්ඡාවට ගැනිම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බවත්, අද දවස තුල මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා , රටේ පවතින කොරෝනා වසංගත තත්ත්වය හමුවේ හා රට තුළ මේ වන විට කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුල පැන නැගී ඇති ගැටළුව හේතු වූ සේම විශේෂයෙන් වගා කිරීම සඳහා පවතින ඉඩම් වල ඇති ගැටළුව සහ වර්තමාන රජය විසින් වරින් වර ගෙන ඇති ක්‍රියාකාරීත්වයත් හේතු වූ බව සඳහන් කරන ලද අතර ආහාර සුරක්ෂිත තාවය තුළින් මිනිසුන් සඳහා අවශ්‍ය ආහාර වල ප්‍රමාණය හා ගුණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අපේක්ෂා කරනු ලබන අතර ඉදිරියේදී ආහාර සපයා ගැනීම සම්බන්ධයෙන් ජනතාව තුල සැකයක් ජනිත වීම හිතකර තත්ත්වයක් නොවේ.එසේම ආහාරයට ගන්නා දේ පිරිසිදු ද , නිසි පෝෂණයෙන් යුක්ත ද යන්න ආහාර සුරක්ෂිතතාවයට ඇතුලත් වන බවත්, සඳහන් කරමින් ඉදිරිපත් කල තේමාව කෙරේ අවධානය යොමු කල යුතු බව සඳහන් කරන ලදී.

සත්‍ය ලෙසම මේ වන විට මෙරට තුල හා ලෝකයේ විවිධ රටවල ආහාර නිෂ්පාදනය සැළකිය යුතු අන්දමින් අඩු වී ඇති සේම, ආහාර නිෂ්පාදනය කරනු ලබන රටවල් නිෂ්පාදනය බිඳ වැටීම හේතු කොට ගෙන වෙනත් රටවල් වලින් කරන ආනයනය ද අපනයනයද අඩු කර ඇති සේම ඉදිරියේදී එය නතර කිරීම පවා සිදු කල හැකි බවත්,එසේ සිදු වුවහොත් මෙරට තුල ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීමේ ගැටළුවක් ඇති විය හැකි බවත්,මෙරට තුල පවතින පාරිභෝගික අවශ්‍යතාවය වැඩි ප්‍රමාණයක් රඳා පවතින්නේ ආනයනය මත බවත් සඳහන් කරන ලද අතර එහි සහල් සඳහා විශේෂ තැනක් හිමි වන බව ද ප්‍රකාශ කරන ලදී

ඉදිරියේදී ස්වයං ආර්ථික රටාවක් ගොඩනැගීම සඳහා ආණ්ඩුව තීරණය කර ඇති අවස්ථාවක පළමු අදියරය ලෙස රසායනික පොහොර වලින් ඉවත් වීම සඳහා ගත් තීන්දුව ඉතා හොඳ නමුත් ඒ සම්බන්ධයෙන් තම පක්ෂය වසර 15 ක සිට දීර්ඝ පරීක්ෂණයක් සිදු කල බවත්, එහිදී තම පක්ෂය කෙදිනක හෝ ආණ්ඩු බලය ලබා ගත හොත් එදිනට රටේ ආර්ථිකය, කෘෂිකර්මාන්තය, විදේශ වෙළඳපොල මත යැපෙන්නේ නැතිව දියුණු කරන්නේ කෙසේද යන පරීක්ෂණය සිදු කල බවත්, එහි ප්‍රථිපල තම පක්ෂය කිසිම කුහකත්වයකින් තොරව රජයට ලබා දුන් හේතුව නිසාම ගරු අමාත්‍ය සශේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා ගොවිබිම් සඳහා පැමිණි සේම මහින්දානන්ද අළුත්ගම මැතිතුමා අප සමඟ සාකච්ඡා කල බවත්, අතිගරු ජනාධිපතිතුමා ජනාධිපති මන්දිරය සඳහා තම පක්ෂයේ නියෝජිතයන් කැඳවූ අවස්ථාවේ කෘෂිකර්මාන්තය දියුණු කල යුත්තේ කුමන ඉසව්වකටද යන්න සැළසුමක් ලබා දීම සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී

නමුත් ඒ ගන්නා ලද පියවර අඩපණ වූ සේම කළ යුතුව තිබූ ක්‍රමවේදය ඉදිරියට නොගිය බවත්, ඒ සඳහා සැළසුම් සහගතව කාර්යයන් ඉටු නොකිරීම ප්‍රධාන හේතුව බවත්, මෙය නිවැරදි කිරීම සඳහා ගත යුතු පියවර කුමක්ද යන්න ඔවුන් ජනාධිපතිතුමා සමඟ 3 වන සාකච්ඡාවේදී ඉදිරිපත් කල සේම, එහිදී සෞභාග්‍යයේ දැක්ම සංකල්පය ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සිදු කල යුතු බවට හා එය ඒ අයුරින්ම සිදු කලානම් රටේ මේ වන විට ඇති වී තිබෙන ව්‍යාකූලත්වය සිදු නොවීමට ඉඩ තිබූ බවත්, මේ තුළ ලංකාවේ කෘෂිකර්මාන්තය විශාල අවුලකට පත් වී ඇති සේම, ඒ තුල ගොවීන්ට හා නිළධාරීන්ට කෘෂිකර්මාන්තය කෙරේ විශ්වාසය නැති වී ගිය බව සඳහන් කරන ලදී.

තවද මේ සඳහා, රාසායනික කෘෂිකර්මාන්තයෙන් යැපෙන ඇතැම් ව්‍යාපාරිකයන් හා නිළධාරීන්ද විවිධ බලවේග ද ක්‍රියාත්මක වූ බවත්, නිළධාරීන් රසායනික කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් පමණක් දැනුම සහිත වීම, ගොවියන් ක්‍රමයෙන් රාසායනික ගොවිතැනට හුරු වී සිටීම ආදිය ගැටළුද පැවති බවත්, මෙලෙස රට පුරා පවතින ගැටළුව මෙම බල ප්‍රදේශයේ ජනතාවටත් මුහුණ දීමට සිදු වී තිබෙන බවත්, පසුගිය කන්න රැස්වීමේදී ගොවීන් විසින් පොහොර ලබා නොදෙන්නේ නම් ජලය අවශ්‍ය නැති බවට ඒකමතික තීරණයකට ඉලඹී බවත්, මෙම තීරණය ලංකාවේ විශාල ප්‍රදේශයක ගොවීන් ලබා ගෙන ඇති සේම ගොඩ වැව් වලද පොහොර නොමැති නිසා වගා කරන්නේ කෙසේද යන දෙගිඩියාවෙන් සිටින බව සඳහන් කරන ලදී. මේ නිසා සත්‍ය ලෙසම මේ කන්නයේ ගොවිතැන සම්පූර්ණයෙන්ම වාගේ අකර්මරණය වී ඇති බවත්, මෙහිදී රසායනික පොහොර වෙනුවට විශ්වාසදායී කාබණික පොහොරක් භාවිතා කිරීම සඳහා අවස්ථාව සලසා දී තිබුනේ නම් මෙම ගැටළුව මතු නොවන බවත් රජය ඒ සඳහා අසමත් වූ බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද මේ වන විටත්, කාබනික පොහොර නිෂ්පාදනය කර තිබෙන පිරිස් වෙතින් එම නිෂ්පාදන මිල දී ගැනීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර නොමැති බවත්, ශ්‍රාවස්තිපුර ප්‍රදේශයේ යුද්ධ හමුදා පොලීසියේ සේවය කල පුද්ගලයෙකු වදාකඩ වැව ආසන්නයේ කුඹුරු යායේ රුපියල් 3,000,000 වියදම් කර කාබනික පොහොර කිලෝ ග්‍රෑම් 150,000 සකස් කර ඇති බවත් , එය මිල දී ගැනීම සඳහා පුද්ගලයෙකු නොමැති බවට තමන් වෙත ප්‍රකාශ කර ඇති සේම, මෙසේ විවිධ තැන්වල නිෂ්පාදනය වන කාබනික පොහොර රටේ අවශ්‍යතාවය වෙනුවෙන් යොදා ගැනීමට රජය නිසි වැඩ පිළිවෙලක් සකස් කර නොතිබීම මෙයට හේතුව වී පවතින බව සඳහන් කරන ලදී.

තවද තම පක්ෂය විසින් ජෛව පොහොර නිෂ්පාදනය කරනු ලබන බවත්, එමගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 8,000 කට පොහොර දෙන බවට ප්‍රකාශ කලත්, එය සකස් කර බලාගෙන සිටියත්, එලෙස සිදු කිරීම සඳහා කොමෂල් පොහොර සමාගම වෙත මෙහි ගිවිසුම අත්සන් කරන ලෙසට ප්‍රකාශ කලත් පසුගිය සතිය වන විටත් එම ගිවිසුම අත්සන් කර නොතිබෙන බව සඳහන් කරන ලදී.

තවද පසුගිය දිනක අතිගරු ජනාධිපතිතුමා අනුරාධපුර දිස්ත්‍රික්කයට පැමිණි අවස්ථාවේදී තමන් ඇතුළුව පුද්ගලයින් 07 දෙනෙකු සමඟ කල සාකච්ඡාවේදී, අතිගරු ජනාධිපතිතුමා වෙත පවතින ගැටළු සම්බන්ධයෙන් සිය අදහස ඉදිරිපත් කල බවත්, එහිදී පවතින පොහොර ප්‍රමාණයෙන් හෝ අදාල නිෂ්පාදන කාර්යය සිදු කර ගැනීමට නිසි යාන්ත්‍රණය සකස් කර ගැනීමට නොහැකි වූ බවට පැහැදිළි වන බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ඒ අනුව මෙලෙස ක්‍රියාත්මක කිරීමට යන හොඳ තීරණයක් නිවැරදි යාන්ත්‍රණයක් නොමැති වීම තුල නරක දෙයක් ලෙසට පත් වීම තුළ අද වන විට ගොවියා දෙගිඩියාවෙන් සිටීම සිදු වන නිසාම බල ප්‍රදේශයේ පමණක් නොව ලංකාව පුරාම ආහාර නිෂ්පාදනය පිළිබඳ ගැටළුවකට අප මුහුණ දී තිබෙන බවත්, මේ නිසාම ආහාර නිෂ්පාදනය සම්බන්ධ ගැටළුවට විසඳුමක් සකස් කර ගැනීමට අපහට නොහැකි වී ඇති බව සඳහන් කරන ලදී.

මෙම පොහොර ගැටළුව සමඟ තව ගැටළුවක්ද පැන නැගී ඇති බවත්, මේ වන විට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉඩම් අක්කර 1466 ක් කොමාරිකා වගාව වෙනුවෙන් ලබා දීමේ සූදානමක් පවතින බව සඳහන් කරමින් 2021 අගොස්තු මස නිකුත් කර ඇති අපනයනය සඳහා කෝමාරිකා ශාකයෙන් ඖෂධීය නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සී/ස අවුරා ලංකා හර්බල්ස් පුද් සමාගම වෙත දීර්ඝ කාලීන බදු පදනම මත ඉඩම් ලබා දීම ලෙසට වූ කැබිනට් පත්‍රිකාව සභා ගත කරන ලද අතර අදාල ආයතනය රාජාංගනය යාය 18 ප්‍රදේශයෙන් දැනට වසර 03 කට පෙර ආරම්භ කල බවත්, එහිදී ගොවීන් 84 දෙනෙකුට අයිති වී තිබූ අක්කර 66 ක වගා බිම් ද ඊට අමතරව තවත් අක්කර 158 ක් ද සම්පූර්ණයෙන් ඩෝසර් කිරීමට කටයුතු කර තිබූ බවත්, එහිදී සම්පූර්ණයෙන් ම ගස් ඉවත් කර, ගල් කැඩීම සිදු කර, කඳු කපා, වන, හා පස විශාල ලෙස විනාශ කර ගම්මානයට පිවිසෙන මාර්ගය දෙපස අඩි 04,05 පමණ ගැඹුරු අගල් කපා තිබෙන බවත්, ඒ එකකටවත් පරිසර ඇගයීම් බලපත්‍රයක් හෝ වන ජීවී දෙපාර්තමේන්තුවේ අවසරයක්වත් ලබා ගෙන නොතිබෙන බවත්, එම අවස්ථාවේදී නීතිමය වශයෙන් කිසිදු අවසරයක් හෝ පනත් කිහිපයක්ම උල්ලංගනය කිරීමක් සිදු කර තිබුණු බවත්, එසේ තිබියදී අනුරාධපුර දිස්ත්‍රික්කය තුල මෙලෙස ඉඩම් අක්කර 1466 ක් ලබා දීමට කටයුතු කරන බවත්, එහිදී නාච්චාදූව ව්‍යාපාරය තුල, නෙල්ලිකුලම, පහළ වැව, දිවුල්වැව, සින්නික්කුලම යන ප්‍රදේශවල පවතින ඉඩම් මෙම ව්‍යාපෘරය සඳහා ලබා දීමට පසුගිය සතියේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ග්‍රාම නිළධාරීතුමන්ලා හරහා මිනිසුන් සමඟ සාකච්ඡා කරන බවත්, එහිදී තමන් ඇතුළු පිරිස ප්‍රාදේශීය ලේකම්තුමා වෙත හා දිසාපතිතුමා වෙත ගොස් විරෝධතාවය දැක්වූ බවත්, එමගින් අදාල සමාගම සම්බන්ධයෙන් අධීක්ෂණයක් සිදු කරන ලෙසට ඉල්ලීම් කරමින් ලිඛිත ව පත්‍රිකාවක් ලබා දුන් බවත්, එමගින් මෙම ආයතනය, 2008 අංක 22 දරණ පනතින් සංශෝධිත 1937 අංක 02 දරණ වන සත්ව හා වෘක්ෂ ලතා ආඥා පනත, 1980 අංක 47 දරණ ජාතික පාරිසරිකත්ව පනතේ 23 වන වගන්තියට අනුව 1993 ජූනි 24 අංක 762/2 දරණ ගැසට් නිවේදනයේ පැවති කොන්දේසි, 1940 අංක 09 දරණ පුරාවිද්‍යා ආඥා පනතට අනුව 2000 ඔක්තෝම්බර් මස 04 වන දින අංක 1152/14 දින පළවූ ගැසට් නිවේදනයේ පැවති කොන්දේසි ,1995 පෙබරවාරි 23 වන දින

අංක 859/14 දරණ ගැසට් නිවේදනයේ කොන්දේසි, යනාදී නෛතික තත්වයන් බෙහොමයක් උල්ලංගනය කර ඇති බවට දක්වා තිබූ බවත් දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද මෙම ආයතනය විසින් කහඹිලියාපිටිය වැව සම්පූර්ණයෙන්ම හාරා ගල් අතුරා එයට සතුන්ටවත් පැමිණීමට නොහැකි සේ වැව විනාශයට පත් කර ඇති බවත්, ඒ සඳහා ද කිසිදු අවසරයක් ලබා ගෙන නොමැති බවත්, සඳහන් කරන ලදී.

මෙවැනි සමාගමක් මෙලෙස මෙම බල ප්‍රදේශයේ ඉඩම් වලට ද මැදිහත් වී මෙවැනි විනාශයක් සිදු කිරීමට කටයුතු කිරීමට සූදානම් වන බවත්, එහිදී අදාල සමාගම විසින් කොමාරිකා වගාව වෙනුවෙන් ඉඩම් ලබා දුන් පසු මාස 06 කින් ඉඩම් සඳහා බලපත්‍ර ලබා දීමටත්, අවුරුදු 10කින් ඔප්පුව සමඟ ඉඩම නැවත ලබා දෙන බවත්, කොමාරිකා අක්කරයනික් මාස 06 ක් තුළ 2100,000 ක ආදායමක් ලබා ගත හැකි බවත්, කෝමාරිකා පැළයක් මාස 06 කදී කි.ග්රෑම් 06 ක් වැඩෙන බවත්, ජලය ලෙස පිරිපහදු ජලය භාවිතා කල යුතු බවත්, අක්කර 02 ක පමණ ඉඩම වගාවට සුදුසු පරිදී සකස් කිරීමට ඔවුන් වෙත රු 2,000,000 වැය වන බවත්, එය ගොවීන්ට ණයක් වන අතර ලැබෙන ආදායමෙන් අදාල ණය පියවා ගන්නා බවත්, වගාව වෙනුවෙන් සම්පූර්ණ ඉඩමේ ගස් කොළන් ඉවත් කල යුතු සේම, අවම වශයෙන් මෙම වගාව වෙනුවෙන් එක තැනකින් අක්කර 10 ක්වත් තිබිය යුතු වන බවටත්, ගොවියා වෙත මසකට රු ලක්ෂ 3 ½ ලබා දෙන බවට සඳහන් කර ඇති බවත්, මෙතුලින් සිදු වන්නේ පොහොර ගැටළුව තුළ වගා කටයුතු සිදු කරන්නේ ද නැද්ද යන දෙගිඩියාව තුල සිටින ගොවීන් මේ සඳහා අවධානය යොමු වීම බවත් සඳහන් කරන ලදී.

තවද මේ සම්බන්ධයෙන් බල ප්‍රදේශයේ විවිධ ස්ථාන වල රැස්වීම් පවත්වා තිබෙන බවත්, එහිදී විමසූ ගැටළු වලදී ඔවුන්ට නිවැරදි පිළිතුරක් ලබා දීමට නොහැකි වූ සේම, මේ සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම්තුමාගෙන් විමසීමේදී, දීර්ඝ කාලීන බදු පදනම යටතේ අදාල සමාගම වෙත වසර 30 ක් සඳහා බදු පදනමින් ලබා දෙන බවට ප්‍රකාශ කල බවත්, ඉඩම් අමාත්‍යාංශය මගින් ප්‍රදේශීය ලේකම් වරුන් වෙත සමාගම සමඟ ගිවිසුම් ගත වන ලෙසට දන්වා චක්‍රලේඛයක් නිකුත් කර ඇතත්, ඔවුන් එය ප්‍රතික්ෂේප කල නමුත් ඉඩම් වෙන් කිරීමට අදාල කාර්යය භාර්යය සිදු කිරීමට සිදු වන බවට සඳහන් කල බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව බල ප්‍රදේශයේ බඩ ඉඟුරු, කව්පි, කුරක්කන්, මුං යනාදිය වගා කල ඉඩම් මේ සඳහා යොදා ගැනීම තුල ඉදිරි කාලය වෙනුවෙන් නිෂ්පාදනය වන්නට නියමිත නිෂ්පාදන අඩු වී යන බවත්, කොමාරිකා වගාව සඳහා අදාල භූමිය ලබා දීම තුල ගොවියාට ලැබිය යුතු නියමිත ලාභයන් හෝ ආදායම ලැබේද යන්න විශ්වාස කරන්නේ කෙසේද යන්නත් ඒ සම්බන්ධ සියළු කටයුතු අදාල සමාගමට අවශ්‍ය පරිදි පමණක් සිදු වන බවත්, හුදෙක්ම මෙය ආහාර නිෂ්පාදනයට බලපාන බැවින් මේ සඳහා අප විරුද්ධ විය යුතුම වන බව සඳහන් කරන ලදී.

තවද මේ සම්බන්ධයෙන් වන විස්තරයක් පුවත්පතෙහි පල වූ අවස්ථාවේදී පාර්ලිමේන්තු රාජ්‍ය අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ අමාත්‍යතුමා විසින් කොමාරිකා වගා කිරීමට අදාල කාර්යය සම්බන්ධයෙන් හෝ කැබිනට් අනුමැතිය සම්බන්ධයෙන් තමන් නොදැනුවත් බවටත්, අනුරාධපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නන්දසේන මැතිතුමා කොමාරිකා වගාව සඳහා ලබා දීමට මෙම දිස්ත්‍රික්කයේ ඉඩම් නොමැති බවටත්, සඳහන් කර ඇති බවත්, මෙසේ ගොවියා සතු ඉඩම් මෙලෙස පෞද්ගලික සමාගමකට දීමේ අවශ්‍යතාවය කාගේ වුවමනාවට සිදු වන්නක් ද යන්න ගැටළුවක් බවත්, කැබිනට් පත්‍රිකාවේ සඳහන් පරිදී, මෙම ඉඩම් ප්‍රමාණයේ රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන පරිදී වසර 30 ක දීර්ඝ කාලීන බදු පදනම යටතේ එම සමාගම වෙත ලබා දීම පිණිස මුදල් අමාත්‍යාතුමා සහ ඉඩම් අමාත්‍යතුමා ඉදිරිපත් කල ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය අනුමත කල බවට සඳහන් වන බවත්, ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනෙකුත් මැති ඇමති වරුන්ටත් හොරා ක්‍රියාත්මක වන මෙම වැඩසටහන තරයේ හෙලා දැකිය යුතු බව දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ආණ්ඩුව විසින් මීට ඉහතදී ගව ඝාතනය නතර කිරීම සඳහා ගෙන ආ යෝජනාව ආගමික වශයෙන් හොඳ මුත් , අපේ රට බහු ජාතික රටක් වන බැවින් සමාජීය වශයෙන් මෙය බලපාන්නේ කෙසේද යන්න ද හඳුනාගත යුතු වන බවත්, එන වසරේ සිට ගව මස් පිටරටින් ආනායනය කරන බවට පුවත්පතක පල වී තිබූ බවත්, පසුගිය දිනක කිරි ගොවීන් සමඟ කරන ලද සාකච්ඡාවකදී ඔවුන් විසින් ඉපදෙන වසු පැටියාට කුමක් කරන්නේ ද යන්න විමසූ බවත්, මේ අනුව කිරි ගොවියාට ගව පාලනය සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගී ඇති බවත්, මෙවැනි තීරණ ජනතා අවශ්‍යතාවය වෙනුවෙන් ගනු ලබන තීරණ බවට පිළිබිඹු නොවන බවත්, මෙසේ ගන්නා සෑම තීරණයක් පිටුපසම පවතින්නේ, ජනතාවට මාරාන්තික වන විසඳුම් බවත්,සඳහන් කරන ලදී.

මෙම කරුණු සැළකිල්ලට ගෙන නැ.නු.ප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා ආහාර නිෂ්පාදන කාර්යය වැඩි කිරීම සඳහා මෙන්ම එහි විශ්වාසය ඇති කිරීම සඳහා මේ සභාව කටයුතු කල යුතු බවත්, ඒ සඳහා තමන් සතුව යෝජනා කිහිපයක්ම පවතින සේම, එහිදි කාබණික පොහොර තිබෙන ප්‍රමාණය මත හොඳ නියමු ව්‍යාපෘතියක් සිදු කර ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කල යුතු බවත්, මෙය ආණ්ඩුපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ විශේෂ අවධානය යොමු කල යුතු තේමාවක් බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර ලබා දෙන බවට ප්‍රකාශ කලත්, සත්‍ය ලෙසම ගෙනවිත් ඇත්තේ, mop හෙවත් රතුකුඩු බවත්, එය අප සියළු දෙනා දන්නා පරිදී, රසායනික වන බවත්, ගැටළුව වන්නේ ඉන්දියාව විසින් මාස 02 කට පෙර භාවිතා කල ඉන්දියාවෙන් ගෙන් වූ නැනෝ යූරියා මූලික පොහොර යෙදීමෙන් පසු අමතර පෝෂණයක් ලෙස යොදන ද්‍රව්‍යක් බව පරීක්ෂණ මට්ටමෙන් හඳුනාගෙන ඇති බවත් මෙම පොහොර ගෙන්වීමේදී, රටේ පවතින ශාක නිරෝධායන පනත යටතේ පරීක්ෂා කර බැලිය යුතු වූවත්, එලෙස කිසිවක් සිදු කර නොමැති බවත්, චිනයෙන් ගෙන් වූ පොහොර සම්බන්ධයෙන් පරීක්ෂාවක් සිදු කල නිසා එම පොහොර නුසුදුසු බවට තහවුරු වූ බවත්, ලංකාව තුල අවශ්‍ය පෝෂ ගුණයෙන් යුතු පොහොර මේ වන විටත් පවතින බවත්, එසේ වපවතින පොහොර භාවිතා කරමින් නියමු වැඩසටහනක් ආරම්භ කිරීමට පියවර ගත යුතු බව සඳහන් කරන ලදී.

තවද බල ප්‍රදේශයේ පවතින වගා කරන ඉඩම් සමාගම වෙත ලබා නොදීමට පියවර ගැනීම ඊළඟ යෝජනාව වන බවත්, මේ සම්බන්ධයෙන් සභා යෝජනාවක් ලබා ගෙන අපේ අදහස ප්‍රදේශීය ලේකම් වෙත යැවිය යුතු වන බවත්, සත්තව පාලනය වෙනුවෙන් ලබා ගත් තීරණය ද ආගමික වශයෙන් සංවේදී වූවත්, ආර්ථිකමය හා ගොවිජනතාව පැත්තෙන් සංකීර්ණ ගැටළුවක් වන බවත්, සඳහන් කරමින්, මේ ප්‍රදේශයේ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් මේ සභාවේ අවධානය යොමු කරනු ලැබූ කරුණු සාකච්ඡාවට භාජනය කර, ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරන මැදිහත්වීම සභාව කරනු ඇතැයි ආපේක්ෂා කරන බවත්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වන බවත්, සඳහන් කරමින් සිය යෝජනාව ඉදිරිපත් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිණිය</u> ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරන ලද අතර, මේ වන විට රටේ අවශ්‍යතාවය වෙනුවෙන් අවශ්‍ය සහල් ආනයනය කිරීම සිදු කරන බැවින් සත්‍ය ලෙස ගත් කල මෙම සහල් රසායනික පොහොර භාවිතා නොකර කාබණික පොහොර මගින් නිෂ්පාදනය කර ඇත්ද යන්න විමසන ලද අතර සහල් වලට අමතරව තවත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය කොපමණ ආනයනය කරන්නේ ද යන්නත්, ප්‍රකාශ කරමින්, ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියනත් මැතිතුමා සඳහන් කල පරිදී අනුරාධපුර දිස්ත්‍රික්කයට අදාල ඉඩම් අක්කර විශාල ප්‍රමාණයක් පෞද්ගලික සමාගමක් වෙත ලබා දීම සඳහා ගෙන යන ක්‍රියාදාමයට අප සම්පූර්ණයෙන්ම සභාවක් ලෙස විරුද්ධ විය යුතු බවත්, එසේ කිරීම මත අප මතු පරම්පරාව වෙනුවෙන් වැඩක් කලා වන බවත්, සඳහන් කරමින් ඒ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන ලෙස සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමී මැතිණිය ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා විසින් ගෙන ආ යෝජනාව ඉතාම සුභදායී බව ප්‍රකාශ කරමින් අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම තුලින්, රසායනික පොහොර වලට එහා ගිය වසවිෂ ශරීරගත වීම වළකාලීම සඳහා මෙම කාබණික පොහොර භාවිතය රැගෙන ආ බවත්, ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් කතා කිරීමේදී ආහාර වල ගුණාත්මක භාවය මෙන්ම ප්‍රමාණාත්මක භාවය සම්බන්ධයෙන් කතා කල යුතු බවත්, වැඩිවන ජන ගහණය සමඟ මෙන්ම හුස්ම ගන්නා සෑම ජීවියෙකු සම්බන්ධයෙන්ම මෙම ආහාර සුරක්ෂිතතාවය වැදගත් වන බවත්, එහිදී වගා කල හැකි ඉඩම් සම්බන්ධයෙන් විශේෂ තැනක් ගන්නා බවත්, අද වන විට වන ජීවීන්ට ඉඩක් නොමැති බවත්, ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා සඳහන් කල පරිදී, විල්පත්තු පේරණ කලාපයෙන් ආරම්භ කල කෝමාරිකා සංකල්පයට තමන් පෞද්ගලිකව විරුද්ධ වන බවත්, තමන් අදාල ප්‍රදේශය පරික්ෂා කිරීමේදී කාන්තාර සංකල්පයක් දක්නට ලැබෙන බවත්, කෝමාරිකා වගාව තුලින් රටේ අවශ්‍යතාවය වෙනුවෙන් නොව විදේශ අවශ්‍යතාවය වෙනුවෙන් නිෂ්පාදනය කරන්නක් බවත්, සඳහන් කරමින් මෙම ව්‍යාපෘතිය තුලින් අදාල වැවද, භූමියද, වන සතුන්ද විශාල ලෙස විනාශ වී ඇති සේම, මෙම භූමිය සමාගමකට ලබා දී එහි කොමාරිකා නිෂ්පාදනය කිරීම තුල එහි වගා කල රටේ ජනතාවගේ අවශ්‍යතා වලට විසඳුම් ලබා දුන් මඤ්ඤොක්කා, කව්පි, මුං බඩ ඉරිඟු වැනි බෝග වගාවන් සිදු කරන්නේ කෙසේද යන ගැටළුව පැන නගින බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද සිරිමාවෝ බණ්ඩාරණායක යුගය එදා අප පිළගත්තානම් අද වන විට මෙරට සශ්‍රික වී ඇති බවත්, 1960 දශකයේදී සදා හරිත විප්ලවය ලෙස මේ ආහාර සුරක්ෂිතතාවය හා කාබණික පොහොර පිළිබඳ ලොකු වැඩසටහනක් ක්‍රියාත්මක වූ නමුත්, ක්ෂණික මුදල් ඉපයීමේ හා වැඩිපුර මුදල් ඉපයීමේ සංකල්පය තුල ක්‍රියාත්මක වන පුද්ගලයින් ලෙස මෙම රසායනික ද්‍රව්‍ය ක්‍රමයෙන් භාවිතයට නැඹුරු වූ බවත්,එමගින් භූමිය නිසරු වන සේම වර්ථමානය තුල පවතින, පිළිකා, වකුගඩු, අධික තරබාරු බව, දියවැඩියාව, අදී රෝග බොහොමයකට හේතුව වී ඇති බවත්, අපේ ශරීර අභ්‍යන්තරය මෙලෙස මුළු මනින්ම පාහේ අකර්මණ්‍ය හා අන්තරාදායක තත්වයට පත් වෙමින් තිබියදී වුවද අප රසායනික පොහොර ලබා දෙන ලෙසට ඉල්ලීම් කරන බවත්, මෙය ආකල්පමය වශයෙන් ද සංවර්ධනය විය යුතු කාරණයක් බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පය, රටේ ජනතාව නිරෝගී පුද්ගලයින් බවට පත් කිරීමට ගෙනා ආ සංකල්පයක් බව අප තේරුම් ගත යුතු බවත්, ටිකෙන් ටික අපේ ඉලක්කය ලගා කර ගත යුතු බවත්, එසේ නොමැති වුවහොත් කොරෝනා වසංගතයත් සමඟ ලෝකය පුරා ඇති වී තිබෙන ඉදිරි ආහාර හිඟය සඳහා අපට සාර්ථකව මුහුණ දීමට නොහැකි වන බවත්, ඒ තුළ, රට අභ්‍යන්තරයේ පවතින ඉඩම් හා වැව් ආහාර වගාවෙන් බැහැර වී ගියහොත් රටේ ආහාර සුරක්ෂිතතාවය නැති වී ගොස් ඉදිරියේදී සාගතයක් ඇති විය හැකි බැවින් සභාවක් ලෙස මෙම කාබණික පොහොර , හා ගොවිපල සංකල්පය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙල සකස් කල යුතු බවත්, මේ තුල පවතින නිළධාරීන්ගේ අකාර්යක්ෂමතාවයද නැති කරමින් කාලාන්තරයක් පුරා රසායනික පොහොර යොදා අකර්මරණ්‍ය වූ පස කාබණික පොහොර යොදා ගනිමින් සශ්‍රීකත්වයට පත් කර ගැනීමට අවශ්‍ය පියවර කඩිනමින් ගනිමුයි යන්නත්, ගරු සභාපතිතුමා වෙත එය සාර්ථකව සිදු කල හැකි බවත්, ඒ තුල බල ප්‍රදේශයේ ගොවි ජනතාවට අවශ්‍ය කාබණික පොහොර නිකුත් කිරීමට අදාල වැඩ පිළිවෙල දියත් කරන ලෙසත්, බෝග වගාවන් සිදු කරන ආකාරය සම්බන්ධයෙන්ද ජනතාව දැනුවත් කල යුතු බවත්, අනාරක්ෂිත ආහාර වෙනුවට ගුණදායි ආහාර භාවිතයෙන් සුරක්ෂිත ජනතාවක් හා ජීවීන්ට සාර්ථක අනාගතයක් ඇති කිරීම පිණිස සුදුසු භෝග වගා කිරීම, විද්‍යාත්මක කළමණාකරණයක් සහිත වීම, හරිත භෝග මාරුවක් ඇති කිරීම ආහාර සුරක්ෂිතතාවයට ඉතාමත් හොද සංකල්ප බව සඳහන් කරන ලදී.

තවද ආහාර ගබඩා කර ගැනීම සඳහා ද අවධානය යොමු කල යුතු බවත්, නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ඉදි කර ඇති ශීතාගාරය තුලින් නාච්චාදූව ජනපදය තුල නිශ්පාදනය කරන කෘෂි භෝග සඳහා උසස් තැනක් හිමි වේවි යන්න අදහස් කලත්, එතුලින් සිදු වන්නේ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයෙන් එළවළු

ගෙනවිත් හොඳ එළවළු පිටරට යැවීම බවත්, මේ සඳහා සභාව මැදිහත් විය යුතු වනවා සේම, සමගමක් නම් එතුලින් බඳු අය කිරීම සිදු කල යුතු බවත්, සඳහන් කරන ලදී.

තවද සභාව විසින් සිදු කරන්නට නියමිත ක්‍රියාදාමය තුල ගබඩාවක් ඇති කිරීම, සහල් මිල දී ගැනීමේ ක්‍රමවේදයක්, පොහොර ලබා දීමේ වැඩපිළිවෙලක් හා ගොවිපලවල් ඇති කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීමටද පියවර ගතු යුතු වන බවත් සඳහන් කරමින් ගරු මන්ත්‍රීතුමා වෙත යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් නැවතත් ස්තූති වන්ත වෙමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> යෝජනාව තුල ඇතුලත් ප්‍රධාන කරුණ ශක්තිමත් බව, ප්‍රමාණාත්මක බව හා අගය ඇතුලත් වන බවත්, ආහාර සුරක්ෂිත තාවය තුල කරුණු කාරණා රාශියක් පවතින බවත්, බෝග වගාව තුල වී හා ධාන්‍ය ලෙස ප්‍රධාන අංශ දෙකක් පවතින සේම ඒ තුල එදිනෙදා ජීවිතයේදී ජනතාව භාවිතා කරන ආහාර සුරක්ෂිතතාවටයෙන් පරිපූර්ණ කරන්නේ කෙසේද යන අදහසට අප අදහස් දැක්විය යුතු බවත්, සුරක්ෂිතතාවය තුල නිෂ්පාදනය අඛණ්ඩව පවත්වාගෙන යාම වැදගත් වන බවත්, ගුණාත්මක භාවය හා භියකින් තොර වීම හා අතිරික්තය ගබඩා කිරීම සඳහා පහසුකම් ඇති කිරීම යන කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කල යුතු බවත්, සඳහන් කරන ලදී.

තවද රටක් ලෙස හා බල ප්‍රදේශයක් ලෙස ගත් කල ආහාර විවිධ  ආහාර කාණ්ඩ වලට අයත් ගුණය වෙනස් වන  සේම ගුණාත්මක භාවය තුල පෝෂණය, රසය, සෞඛ්‍ය සම්පන්න බව, ශාරිරික ඔරොත්තු දීමේ හැකියාව යන කාරණය මත රඳා පවතින බවත්, ඒ අනුව එම කරුණු ආහාර සුරක්ෂිත තාවය කෙරෙහි සෘජුවම බලපාන බවත්, ශ්‍රී ලංකාව වැනි රටක් ආහාර සුරක්ෂිතතාවය රටේ වායූ ගෝලීය වෙනස්කම් අනුව නිෂ්පාදන ක්‍රියාවලිය හා ආහාර ආරක්ෂා කර ගැනීම වැදගත් වන බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ආහාර සුරක්ෂිතතාවය නොතිබීම තුල වර්තමානයේ ඇතැම් රෝගාබාධ ඇති වීම ආදීය සිදු වන සේම ඒ සඳහා බලපාන හේතුව ලෙස රසායනික පොහොර හා කෘමී පලිබෝධ භාවිතා කිරීම ප්‍රධාන අංගයක් වන බවත්,මේ සඳහා විවෘත ආර්ථිකය බලපෑ බව සියළු දෙනා දන්නා බවත්, අතීතයේදී අප මේ සම්බන්ධයෙන් කතා නොකල බවත්, එකල කාබණික පොහොර යොදා ගනිමින් සිදු කල නිෂ්පාදන තුල ආහාර සුරක්ෂිතතාවය නිසි පරිදී තිබූ බවත්, සඳහන් කරමින් වර්ථමානය වන විට ජනතාව පිටරටින් ගෙන්වනු ලැබූ රසායනික පොහොර කෙරෙහි ඇබ්බැහි වීම තුල කාබනික පොහොර ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරන මුත්, ඉතිහාසය පුරා කාබණික පොහොර  භාවිතා කිරීමට අප නැඹුරුව සිටින බවත්, රටේ කාබනික ගාවිතැන සිදු කරන පුද්ගලයින් ඔනෑතරම් සිටින බවත්, එය සියළු දෙනා දන්නා සේම , මේ තුල අස්වැන්නක්, ලැබේද නැද්ද යන බියක් පැන නැගීම මත ගොවියන් විසින් පාරට බැස පොහොර ඉල්ලීම් කිරීම සිදු කරන බවත්, මේ සඳහා ඉදිරි මාස කිහිපය තුල රජය විසින් පිළිතුරු දෙනු ඇති බවත්, ඉදිරියේදී දුෂ්කරතා මැද වූවත් නිවැරදි කාබණික පොහොර යෙදූ රසායනික පොහොර වලින් තොර ආහාර සුරක්ෂිත තාවය ආරක්ෂා කර ගනිමින් අනාගත පරපුර වෙනුවෙන් යමක් කල හැකි වන බව සඳහන් කරන ලදී.

තවද කෝමාරිකා වගාවට අදාල භූමිය පරීක්ෂා කිරීම සඳහා දිනක් තමන් ගිය බවත්, එහිදි ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා සඳහන් කල කරුණු දක්නට ලැබූ බවත්, මෙය රටට ගැලපෙනවාද නොගැලපෙනවාද යන්න හිතනවාට වඩා ජනතාවට යම් වාසියක් ලැබෙනවාද යන්න පරීක්ෂා කල යුතු බවත්, කොමාරිකා වගාව පසෙකින් තබා අපේ පස තුල ආහාර සුරක්ෂිතතාවය රකින්න වගා කරන කිසිදු භෝගයක් පසට නොගැලපෙන බැවින් මොනයම් හෝ ක්‍රමයකින් මේ භූමියට හා පසට ගැලපෙන පොළවේ ස්ථාපිත කල හැකි යම් කිසි වගාවක් පවතිනම් එය ආහාර සුරක්ෂිතතාවයට ප්‍රමාණවත් වන්නේ නම් ශරීර සෞඛ්‍යට සුදුසුනම් ජනතාවට ආර්ථික වාසියක් හිමි වන්නේ නම් අප පොළවට ගැලපෙන කුමන හෝ භෝගයක් ස්ථාපිත කල යුතු බව සඳහන් කරන ලදී. එය කෝමාරිකා සම්බන්ධයෙන් සිදු කරන ප්‍රකාශයක් නොවන බවත්,පසට ගැලපෙන කුමන හෝ භෝගයක්  වර්ථමානයේ අපට වගා කිරීමට නොහැකි නම් එයට හේතුව විමසා එයට

ගැලපෙන භෝගයක් වගා කල යුතු බව සිය අදහස බවත්, සඳහන් කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන ගරු සභිකවරයෙකු ලෙස ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා රජය ශක්තිමත් කිරීම වෙනුවෙන් ගෙන එන ලද යෝජනාවට පක්ෂපාතීව අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් තමන් සතුටු වන බව සඳහන් **කරමින් රටක සියළු ජනතාවට ඕනෑම අවස්ථාවක භෞතිකව, ප්‍රමාණවත් ලෙස, සුරක්ෂිත පෝෂදායී ආහාර ආර්ථික හැකියාව අනුව ලබා ගත හැකි වීම හා ක්‍රියාශීලි සෞඛ්‍යමත් ජීවිතයක් සඳහා තමන්ගේ කැමැත්ත අනුව කරදරයකින් හා බාධාවකින් තොරව ආහාර ලබා ගැනීමට හැකි වීම**, එම රටේ ආහාර සුරක්ෂිතතාවය ලෙස අර්ථ දක්වා ඇති බවත්, ඒ අනුව ලංකාව ආහාර සුරක්ෂිත තාවය ඇති රටක්ද නැති රකටක්ද යන්න වටහා ගත යුතු බවත්, 1948 ජනවාරි මස 31 වන දින බ්‍රිතාන්‍ය විසින් අපට නිදහස ප්‍රධානය කරන විට එවකට සිටි පාලක පක්ෂය නිදහස භාර ගැනීමට අකමැති වී අපට නිදහසක් අවශ්‍ය නැත අප ඔබලා යටතේ පාලනය වීමට කැමති බවට සඳහන් කර ඇති බවත්, එහිදී නිදහස ලබා දිය යුතු බවට ප්‍රකාශ කිරීමේදී පාලක පක්ෂය විසින් හැමදාම සැමරීම සිදු කල හැකි දිනයක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටි බවත්. ඒ අනුව එවකට සිටී සෝල්බරි සාමි වරයාගේ බිරිඳගේ උපන් දිනය වන පෙබරවාරි 04 වන දිනය මෙලෙස අපට නිදහස් දිනය සැමරීම සිදු කරන බවත්, තත්වය එසේ තිබියදී, ලැබුණු භාණ්ඩාරගාර අතිරික්තය සඳහා රටේ සංවර්ධනය නිසි ආකාරයෙන් යොමු කරනවා වෙනුවට රටේ ජනී ජනයාට යැපීම් මානසිකත්වයක් උරුම කරමින් හාල් සේරු නොමිලයේ ලබා දීමට කටයුතු කල බවත්, කණගාටුවෙන් යුතුව සඳහන් කරන ලදී.

තවද මාවෝ සේතුං විසින් මිනිසෙකුට මාළුවෙක් දෙනවාට වඩා බිලි පිත්තක් ලබා දීම සුදුසු බවට ප්‍රකාශයක් සිදු කර ඇති බවත්, එදා නිසි සංවර්ධන ක්‍රමවේදයකට රට යොමු කරානම් මේ රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා මෙන්ම ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් අද කතා කිරීමට කිසිසේත් සිදු නොවන බවත්, ඌණ සංවර්ධනය හා සංවර්ධනය වෙමින් පවතින රටවල් වල පමණක් මෙතරම් විශාල මුදලක් ආහාර වෙනුවෙන් ගෙවීමට සිදු වන බවත්, සංවර්ධිත රටවල් වල පවතින වැදගත්ම කාරණය වන්නේ ඔවුන් ආහාර වෙනුවෙන් ඉතා අඩු මුදලක් වැය කිරීමට සිදු වීම බවත්, මේ කාරණය දිගින් දිගටම එසේ තිබියදී, එය වෙනස් කිරීමට හැකිවූ එකම පක්ෂය ලෙස ට තමන් නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 1956 බණ්ඩාරණායක ශ්‍රීමතානන්, සංවර්ධන ක්‍රියාදාමයේ හැරවුම් ලක්ෂය බවට මේ රට පත් කිරීමට කටයුතු කල බවත්, අවාසනාවකට වර්ථමානයේ අතිගරු ජනාධිපතිතුමා ක්‍රියාත්මක කිරීමට උත්සහ කරන ආකාරයටම රට යහපත් අතට හැරවීමට උත්සහ කිරිමේ දී බණ්ඩාරණායක ශ්‍රීමතානන් වෙත මෙලොවින් සමු ගැනීමට සිදු වූ නමුත් එතැනින් නොනැවතුණු ගරු සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණිය පාලන බලය ලබා ගෙන දේශීය ආර්ථිකයට මුල් තැන දෙමින් 1976 දී විනිමය අතිරික්තයක් රට තුල ඇති කිරීමට කැප වී කටයුතු කල බවත්, ඒ තුල රටට අවශ්‍ය රෙදි පිළි නිශ්පාදනය, හාල්, සීනි, ඇතුළු ධාන්‍ය වර්ග ද, අල වර්ගද , රට තුල නිෂ්පාදනය කිරීමට ඉතාම උනන්දුවෙන් කටයුතු කල බවත්, නොබෙදි සමුළුව ලංකාව තුල පවත්වා, රටට ලෝකයට පෙනෙන නායිකාවක ලෙස සංවර්ධන මාවත ඇසට පෙනි පෙනි තිබියදී, 1977 පැමිණි මැතිවරණයට ආසන්නව අප නොසිතු පරිදී රටේ ඇති වූ දැවැන්ත නියගයත් සමඟ එම මැතිවරණ වෙදීකාව තුල විපක්ෂය ලබා දුන් පොරොන්දු සමඟ මැතිවරණය පරාජය වූ බවත්, එහි ප්‍රතිපලය අද සාකච්ඡාවට බදුන් වී ඇති, දේශීය ආර්ථිකය බිද වට්ටා විවෘත ආර්ථිකය ගෙනවිත්, එයිනුත් හොඳ දේවල් නොගෙන වැරදී දේ ගත්ත නිසා ආහාර සුරක්ෂිතතාවය පමණක් නොව ආහාර සංස්කෘතිය පවා බිඳ වට්ටා තිබෙන බවත්, උදාහරණ දක්වමින් සඳහන් කරන ලදී.

තවද විවෘත ආර්ථිකය හේතු කොට ගෙන පැමිණි තාක්ෂණය තුල වර්ථමානයේ කාර්යය බහුල සමාජයට උපකාරයක් සැපයූවද , සැමියා හා බිරිඳ කුඹුරු පිටියේ, හේනේ ගොවිතැන් කරමින් තිබියදීද එම තාක්ෂණික උපකරණ අවශ්‍ය වීම මත ආහාර සංස්කෘතිය වෙනස් වීමට ආරම්භ වූ බවත්, විවෘත ආර්ථිකය සමඟ කාන්තාවන් හැඩගන්වන උපකරණ වල සිට අවශය හා අනවශ්‍ය , කෘතිම රසකාරක අඩංගු , ආහාරද ගෙන්වීමට කටයුතු කල බවත්, එතුල අප රෝගීන් බවට පත් වූ බවත්, අද වන විට මේ රටේ ජනතාවගේ

නිරෝගී භාවය සමග බහු ජාතික සමාගම් විසින් මහ විශාල ප්‍රහාරයක් එල්ල කරන බවත්, අතිගරු ජනාධිපතිතුමා කොන්දක් තිබෙන නායකයෙකු ලෙස කාබනික පොහොර වලින් මේ ගැටළුවලට විසඳුමක් ලබා දිය හැකි සේම රට සංවර්ධනය කරමින් දේශීය ආර්ථිකය ගොඩනැගිය හැකි බවටත්, නිරෝගී සෞඛ්‍යමත් පරපුරක් බිහි කල හැකි බවට අදහස් කල බවත්, සඳහන් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමා ගෙන යනු ලබන මෙම වැඩපිළිවෙල සඳහා පාර්ශ පක්ෂ භේදයකින් තොරව එක්ව ගමන් කරන්නේ නම් අප අතිගරු ජනාධිපතිතුමා ගත් ක්‍රියාදාමයට අත්වැල් බැඳ ගත්තා වන බවත්, සඳහන් කරමින් බහු ජාතික සමාගම් මෙහිදී පිටු දැකීම අනිවාර්යෙන්ම සිදු කල යුතු බවත් ගව ඝාතනය නතර කිරීම සඳහා රජය ගත් වැඩ පිළිවෙල ද බහු ජාතික සමාගම් වල කුමන්ත්‍රණයක් බවත්, සව ඝාතනය නතර කිරීමට තීරණය කල මුත් කුකුලන් විශාල වශයෙන් මරණයට පත් කිරීම තුල සිදු වන යහපත කුමක්ද යන්නත්, අද වස්සන් සඳහා කුමක් සිදු කරන්නේ ද යන ගැටළුව පැන නැගී ඇති බවත්, දීර්ඝ ලෙස කරුණ දක්වමින් සඳහන් කරන ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා නැ.නු.ප ප්‍රාදේශීය සභාව ශ්‍රී ලංකාව තුල යම් උස් මට්ටමකට ඔසවා තැබීමේ හැකියාවක් අප සියළුදෙනාම එකට එක්වී කටයුතු කිරීම තුලින් ලබා ගත හැකි බවත්, 2010 වර්ෂයේ දී පැවති වැඩමුළුවකදී 2025 වර්ෂයේදී , ජල හිඟයක් හා ලෝක ආහාර හිඟයක් ඇති වේය යන්න සඳහන් කර ඇති බවත්, එහි සත්‍ය අසත්‍යතාවය කෙසේද යන්න නොදන්නා මුත් ඒ වෙනුවෙන් අප සූදානම් විය යුතු බවත්, මීට පෙරදී සෑම ගෙදරකටම බීජ ලබා දී ගෘහ ආර්ථිකය නගාසිටුවමින් නිෂ්පාදන ධාරිතාවයට පුංචි හෝ දායකත්වයක් ලබා ගැනීමට අපේක්ෂා කල නමුත් එම වැඩ පිළවෙල අසාර්ථක වී ඇති බවත්, අනෙකුත් යටිතල පහසුම් සපයා දෙනවා සේම අවම වශයෙන් මෙම ආහාර නිෂ්පාදනය කර ගැනීම සඳහා බල ප්‍රදේශයේ එක් නිවසක් ගෙවත්තක් වෙනුවෙන් මඤ්ඤොක්කා දඬු කැබලි දෙකක් දීම හෝ කල හැකි නම් එතුලින් ලැබෙන වාසිය ඉමහත් බවත්, මේ සඳහා දීර්ඝ කාලීන හා කෙටි කාලීන වැඩ පිළිවෙලක් ලෙස බීජ ලබා දීම සිදු කල හැකි බවත්, මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අනෙකුත් ප්‍රාදේශීය සභාවන්හි අවධානය යොමු වීම අනිවාර්යෙන් සිදු වන බවත්, දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද පනත ප්‍රකාරව ජනතාව ගෙවතු වගාව කෙරේ අවධානය යොමු කරවා ගැනීම වෙනුවෙන් ඔවුන්ට අවශ්‍ය ආයුධ හා උපකරණ ලබා දීමේ හැකියාව පවතින බවත්, ඒ තුලින් ද කොරෝනා වසංගතය සේම ඩෙංගු වසංගතය වෙනුවෙන්ද විසඳුමක් ලබා දිය හැකි වන බවත්, සඳහන් කරන ලදී. මීට අමතරව බල ප්‍රදේශයේ මාර්ග සියල්ල ආවරණ වන පරිදී කොස් පැල ලක්ෂයක් හා අඹ පැල 50,000 ක් සිටුවීම හා මිරිස් ඇට තවන් කර එක් ගෙවත්තකට මිරිස් පැල 10 ක් ලබා දීම කොට්ඨාශ මට්ටමින් සිදු කිරීමේ හැකියාව පවතින බවත්, එවැනි වැඩ පිළිවෙලක් දියත් කිරීම තුල විශාල ආදායමක් ජනතාවට ලබා ගත හැකි සේම ඒ තුල ආහාර සුරක්ෂිතතාවය ඉහලින් ම රැකෙන බවත්, සඳහන් කරන ලදී.

තවද, නාච්චාදූව ව්‍යාපාරය තුල හා යහලේගම ප්‍රදේශයේ වතුර ගලා බසින ඇල මාර්ග තුල උණ පැළ රෝපණය කිරීම තුල උණ ශාකය මගින් කර්මාන්ත 1500 කිසිදු කල හැකි බවත්, ඒ තුල ජනතාවගේ ආර්ථිකය ගොඩ නැංවීම සඳහා පියවර ගත හැකි බවත්, ඒ සඳහා උණ පැල ලක්ෂ 10,05 ක් සිටුවීමේ හැකියාව පවතින සේම උණ ශාකය සිටුවීම තුල සංක්‍රමණික පක්ෂීන් සංක්‍රමණය වන බවත්, දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

අනතුරුව ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ගෙන ආ යෝජනාව ජනතා විමුක්ති පෙරමුණේ යෝජනාවක් නොව රජය රැක ගැනීම සඳහා ගෙන එන යෝජනාවක් බවත්, මේ සඳහා ප්‍රාදේශීය සභාව මැදිහත් කර ගන්නේ කෙසේද යන්න පිළිබඳ ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කල යුතු බවත්, සඳහන් කරමින් සිය ප්‍රකාශයේ සාරංශයක් නැවත ඉදිරිපත් කර, යෝජනාව තුලින් බල ප්‍රදේශයේ ජනතාව යහපත් තැනකට ඔසවා තැබීමට අවශ්‍ය නිර්ණායකයක් සකස් කර නැ.නු.ප ප්‍රාදේශීය සභාවේ ජනතාව ලංකාවේ සතුටින්ම සිටින ජනතාව බවට පත් කිරීමට හැකි වන්නේ නම් අපටද සතුටක් ලැබෙන බව සඳහන් කරමින් මෙම ක්‍රියාදාමය එක් කොට්ඨාශයකින් ආරම්භ කර අනෙක් කොට්ඨාශ සඳහා ක්‍රමයෙන් දියත් කිරීට කටුයුතු කරන ලෙස ප්‍රකාශ කරමින් ආහාර සුරක්ෂිතතාවය සහිත බල ප්‍රදේශයක් ඇති කරමුයි යන්න ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී පි.එස්.බී සිරිවර්ධන මැතිතුමා අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් තුල රටට රසායනික පොහොර හා කෘමි නාශක නවත්වන බවට තීරණය කිරීමට ප්‍රථම වසර 03 කට සරිලන කෘමිනාශක ගෙනවිත් තිබූ නමුත් ගොවිතැන් කරන ගොවියෝ ලෙසට අප රු 25,000 කට සරිලන සේ කෘමි නාශක ලබා ගත් විට රු 9,000 ක පමණ කොමිස් මුදලක් හිමි වූ නමුත් රසායනික පොහොර නවත්වන බවට ප්‍රකාශ කර දින සිටම අදාල ව්‍යාපාරකයින් රසායනික පොහොර හා කෘමි නාශක සගවා තැබීමට කටයුතු කල බවත්, ඉන් අනතුරුව කිසිදු කොමිස් මුදලක් හෝ නොගෙන අදාල පොහොර ගොවි ජනතාවට ලබා දීමට කටයුතු කල බවත්, තම කොට්ඨාශය තුල පවතින සුළු වාරි වැව් 08 සහ මහ වාරි වැව් 02 මගින් විශාල ගොවි ජනතාවක් සිය ගොවිතැන් කටයුතු සිදු කල බවත්, එසේ තිබියදී අනාගතයේදී ආහාර හිඟයක් එන බවටත්, පොහොර නිසා ගොවිතැන් නොකරන බවටත්, යන්න ප්‍රකාශ කරමින් බිය වද්දා ගොවීන්ට අභියෝග එල්ල කරන බවත්, අතිගරු ජනාධිපතිතුමා ඇතුළු විෂය භාර අමාත්‍යවරුන් මේ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙල දියත් කරගෙන යන බවත්, කොම්පෝස්ට් පොහොර භාවිතය තුලින් යම් අලාභයක් සිදු වුවහොත් ඒ වෙනුවෙන් රජය වන්දි ගෙවන බවටත් ප්‍රකාශ කර තිබියදී කිසිවෙකු මේ පිළිබඳව කිසිදු සොයා බැලීමකින් තොරව **පොහොර එපා වතුර නැතිනම්** යන්න ප්‍රකාශ කරන බවත්, මේ හේතුන් නිසාම බැරි වෙලා හෝ මේ කන්නය තුල වගා කටයුතු නිසි පරිදි සිදු නොකලහොත් එහි විපාක තව මාස 06 කින් ලැබෙන බවත්, එසේ වුවහොත් අහිංසක ගොවීන්ට කුමක් සිදු වන්නේද යන්නත්, උද්ගෝෂණ පවත්වන්නන් ඒ අවස්තාවේදී අහිංසක ගොවීන් වෙනුවෙන් කුමක් කරන්නේ ද යන්නත්, සඳහන් කරන ලද අතර තමන් මේ වන විට ගොවි සංවිධාන නියෝජිතයෙකු ලෙස හා කොට්ඨාශයේ වගකිව යුතු පුද්ගලයෙකු ලෙසත් වී බුසල් 50 හෝ ලබා ගැනීමට වතුර ආපු ගමන් කුඹුරට බහින ලෙස සිය කොට්ඨාශයේ සියළුම ගොවීන් දැනුවත් කර තිබෙන බව දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද මෙය සාර්ථක වේද නොවේද යන්න සිතනවා වෙනුවට ක්‍රියාත්මක කිරීමට ආරම්භ කිරීම සුදුසු බවත්, සියළු දෙනාම එකට එකතු වී ගොවීන් දැනුවත් කර ඉදිරියේ එන ආහාර හිඟය නවතාලීම සඳහා ගොවීන් දිරි ගන්වා වී ගොවිතැනත්, අනෙකුත් අතුරු භෝගත් නිසි පරිදි වගා කිරීම සඳහා අවශ්‍ය පියවර ගනිමුයි යන්න ගරු සභාවෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින ලද අතර ගියවර කන්නය තුලද පොහොර නොමැති බවට සඳහන් කල මුත් පසුගිය කන්නය පුරාම තම ප්‍රදේශයට පොහොර හිමි වූ බවත්, මේවායෙහි අක්‍රමිකතා නැතිවාම නොවන බවත්, ඇතැම් කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිළධාරීන් සිටින මුත් ඔවුන්ද ක්‍රියාකාරි නොවන බවත් සඳහන් කරන ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා මේ පොහොර අර්බුදය විසඳීමට රජය මගින් ලබා දෙන කොම්පෝස්ට් පොහොර හෝ නයිට්‍රජන් දියර පොහොර හෝ වේවා අපේ සෑම තුලානයකම එක් පුද්ගලයෙකු නම් කර ඒ පුද්ගලයා හරහා රජය මගින් ලබා දෙන පොහොර වගකීමෙන් යුතුව බෙදා දීමට වැඩසටහනක් යෝජනා කරන බවත්, එතුලින් කළු කඩ කාරයින්ට ඉඩක් නොලැබෙන බවත්, නිසි අධීක්ෂණය මේ සඳහා යොමු කල යුතු සේම බිම් මට්ටමෙන් වැඩපිළිවෙලක් සකස් කර ගත යුතු බවත්, ඒ සඳහා පාට පක්ෂ භේද නොතකා එකමුතුව වැඩ කරමුයි යන්න ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා 1950 ,1960 දශකය තුල කෘෂි රසායන ද්‍රව්‍ය වලින් තොර භෝග වගාවකට යන ආකාරය හඳුන්වා දුන් අතර එකල උපතේදී ආයු කාලය වසර 59 දින 37 ලෙස දක්වා ඇති බවත්, එයින් පසුව අපේ රට 60% ක ආහාර පිටරටින් ආනයනය කිරීමට ආරම්භ කල බවත්, 1940 මෙරට ජනගහණය මිලියන 7.9 ක් වූවත්, මේ වන විට රටේ ජනගහණය මිලියන 21 වන සේම මේ වන විට ආයු කාලය වසර 75 දින 81 ක් වන බවත්, එසේ තිබියදී රසායනික පොහොර තුලින් සිදු වී ඇත්තේ, කුමක්ද යන්න ගැටළු සහගත බවත්, මේ වන විට ජනතාවගේ ආයු කාලය වැඩි වී ඇති සේම ආහාර අතිරික්තයක්ද පවතින බවත්, 60% ක ආහාර අවශ්‍යතාවය මේ වන විට ආනයනය නොකරන බවත්, මෙහි කුමන හෝ ගැටළුවක් තිබෙන බවත්, එසේ නොමැතිනම් අප ආහාර සුරක්ෂිත භාවය ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව වැඩි කර ගෙන පවතින්නේ ද යන්නත්, අපට ආහාර නිෂ්පාදනයේදී බීජ, ජලය හා මානව සම්පත සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බවත්, මෙම කන්නයේ වගාව සිදු කිරීමට අනුරාධපුර දිස්ත්‍රික්කය තුල නොහැකි වුවහොත්, ඊළඟ වසර වන තුරු සිටිය යුතු බවත්, එතෙක් ගොවියාට ආදායම් මාර්ගයක් ලෙස කුමක් පවතින්නේද යන්නත්, ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය ධාන්‍ය වර්ග ගෙන්නන්නේ කොහෙන්ද යන්නත්,

රට තුල විශාල වශයෙන් කතා කරන කෘෂි රසායන භාවිතා කිරීම හානිදායක වූවත්. චීනයේ හෙක්ටයාරයකට කෘෂි රසායන කිලෝ ග්රෑම් 13.1 භාවිතා කරන මුත් ලංකාව හෙක්ටයාරයකට කෘෂි රසායන කිලෝ ග්රෑම් 0.7 පමණක් භාවිතා කරන බවත්, තත්වය එසේ තිබියදී ලංකාවේ නිෂ්පාදන ධාරිතාවය පහළ වැටීම තුල අවශ්‍ය ආහාර ආනයනය කිරීමට සිදු වන්නේ චීනය වැනි රටවල් වලින් නොවන්නේද යන්නත්, එම ආහාර සුදුසුද යන්නත්, විමසන ලදී.

තවද යම් හොඳ දෙයක් කෙටි කාලීනව ලබා ගැනීමට උත්සහ කිරීම තුල අපහසුතාවයට පත් වන්නේ අපේ රටේ ජනතාව වන බවත්, අද වන විට ගොවියා අසීරු තැනක සිටින බවත්, මේ වන විට ගොවියාගේ නිෂ්පාදන 30% කින් අඩු වී ඇති බවත්. මෙම යතාර්ථය සඳහා කුමක් කරන්නේද යන්නත් විමසන ලදී.

තවද හීන්න කන්ද ආශිත අක්කර 90 ක වන සංරක්ෂණ අධිකාරිය යටතේ පවතින භූමිය රාජ්‍ය නිළධාරීන් හා ප්‍රදේශයේ ග්‍රාම නිළධාරීන් එක්ව මේ වන විට කට්ටි කර භූමියට විශාල හානියක් සිදු කර තිබෙන බවත්, මෙම භූමිය ආහාර සුරක්ෂිතතාවය වෙනුවෙන් ආරක්ෂා කර ගත යුතු බවත්, 1940 දශකය තුල අක්කරයකට වී බුසල් 12 ක් පමණක් නිෂ්පාදනය කලත් මේ වන විට එය 93 ක ප්‍රමාණයක් පෙන්නුම් කරන බවත්, මේ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ප්‍රකාශ කරමින් ගෙනා ආ යෝජනාව අන්තයකට නොගෙන පවතින් පුළුල් විග්‍රහය තුල ඉදිරි කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා</u> කාබනික නිෂ්පාදනය හා හරිත රටක් ඇති කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් ගෙන ආ විකල්පය පිළිබඳ එතුමා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් , ගිය කන්නයේ සිටම මෙයට මුහුණ දීම වෙනුවෙන් සෑම නිළධාරියෙකුම පරීක්ෂණ කටයුතු හා අධීක්ෂණ කටයුතු සිදු කරමින් යම් මට්ටමකට මෙම යෝජනාව ගෙනවිත්, ඇති බවත්, එහි එක් අංගයක් ලෙස රටේ ආහාර හිඟය වෙනුවෙන් 2020 වර්ෂයේ සිට ගෙවතු වගාව සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බවත්, ලංකාව පුරා ලක්ෂ 25ක් ,30ක් පමණ ගෙවතු වගාව වෙනුවෙන් රජය මැදිහත් වී අති සාර්ථක ප්‍රතිපල ලැබූ බවත්, සඳහන් කරන ලද අතර ලංකාවේ කෘෂිකර්මාන්තය වෙනුවෙන් පත් කල විශාල නිළධාරීන් සංඛ්‍යාවක් සිටියදී ගොවීන්ට අවශ්‍ය දැනුම නිසි පරිදි ලැබෙනවාද යන ගැටළුව පවතින බවත්, පසුගිය දිනවල පැවති ගොවි උද්ඝෝෂණ වලට හේතුවද මෙය වන බවත්, සඳහන් කරන ලදී.

තවද නාච්චාදුව ශීතාගාරය පසුගිය ආණ්ඩුව කාලයේ ඉදි කල බවත්, ඒ සම්බන්ධයෙන් ස්තූතිවන්ත වන නමුත් එය ඉදි කිරීමෙන් පසු වසර 03 ක් වසා දමා තිබූ බවත්. එය ඒකාබද්ධ ගොවි සංවිධානය විසින් කිසිදු කාර්යයක් සිදු නොකරම නැවත යතුර භාර කල බවත්, අද වන විට එය පවත්වාගෙන යන සමාගම විසින් එළවළු 10,000 kg පමණ පිටරට යැවීමේ කාර්යය ඉටු කරන බවත්, මේ සඳහා ලංකාවේ සිව් දෙසින් එළවළු ලබා ගැනීම සිදු කරන බවත්, මේ වන විට එය විශාල ජාලයක් බවට පත් වී තිබෙන බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද 1970 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය විසින් දේශීය ආර්ථිකය ගොඩනැංවීම සඳහා පියවර ගනු ලැබුවත් අවසනාවකට 1977 දී විවෘත ආර්ථිකය පැමිණ බීජ, කෘෂි නිෂ්පාදන විනාශ වී ගිය බවත් බහු ජාතික සමාගම් ද ඒ සඳහා වගකීම දැරිය යුතු බවත්, මේ තුලින් වර්ථමාන ආර්ථිකයට විශාල බලපෑමක් සිදු කර ඇති බවත් සඳහන් කරන ලදී.

තවද අතිගරු ජනාධිපතිතුමාගේ මෙම සංකල්පය කවුරු හෝ හොඳ නැත යන්න සඳහන් කරමින් විවේචනය කරනවා නම් එය අහිංසක ගොවියන්ට සේම ලෝකයේ තාක්ෂණයට හා හරිත සංකල්පය වෙනුවෙන් කරන විවේචනයක් බවත් සඳහන් කරමින් මෙම විවේචනය පසෙකලා ගොවිතැන් කටයුතු වෙනුවෙන් වූ කාර්යය ආරම්භ කරන ලෙසත් ඉදිරියේදී රජය විසින් අවශ්‍ය පොහොර ජනතාවට ලබා දීමට අදාල පියවර ගන්නා බවත් දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර, රජය විසින් ගනු ලබන පියවරයන් සම්බන්ධයෙන් විවේචන ඉදිරිපත් කරනවාට වඩා එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න අප සොයා බැලිය යුතු බවත් සඳහන් කරමින් අතිගරු ජනාධිපතිතුමාගේ හරිත රටක් යන සංකල්පය අපේක්ෂිත අයුරින් ඉටු කර ගැනීමට ශක්තිය ධෛර්ය ලැබේවායි යන්න ප්‍රාර්ථනා කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ.ශාන්ත මැතිතුමා අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාගයේ දැක්ම යටතේ හරිත සංකල්පය මත කාබනික පොහොර සඳහා යොමුවීම එතුමා කලක සිට අදහස් කර ගෙන සිටි කටයුත්තක් බවත් 60 දශකය හා 70 දශකය අග භාගය වන විට අපේ ගොවියා හේන් ගොවිතැන හා කුඹුරු ගොවිතැන කෘෂි රසායනික ද්‍රව්‍ය වලින් තොරව වගා කළ නමුත්, 70 දශකය වන විට අපේ සෑම ගෙදරකම එළ ගවයෙකු සිටි බවත් කිරිවලින් ස්වයංපෝෂිත වූ බවත් පිටරටින් ආහාර පැමිණීමත් සමඟ දේශීය නිශ්පාදනය අඩුවීමට ආරම්භ වූ සේම බහු ජාතික සමාගම් විසින් රසායනික පොහොර ගෙන ඒමත් සමඟ ගොවියා පැරණි කෙම් ක්‍රම අමතක කර ක්ෂණික ක්‍රියාමාර්ගවලට හුරු වූ බවත් එදා හේන කුරුල්ලන් විසින් ආරක්ෂා කල නමුත් කෘෂි නාශක භාවිතයත් සමඟ එය වෙනස් වූ බවත් එමඟින් විස රසායන ශාකවලට එක් වූ බවත් මේ තත්වය දිගින් දිගටම පැමිණ වසර 50 ක් පුරා අපේ ගොවිබිම් මුඩුබිමක් බවට පත් කර තිබෙන බවත් මේ තුල කාබනික පොහොර භාවිතා කරන ලෙසට උපදෙස් ලබාදුන් නමුත් වෙළඳපොල තුළ රසායනික පොහොර තිබෙන තාක්කල් එය සිදු නොවන බැවින් එය පාදක කරගනිමින් මෙලෙස ක්ෂණිකව රසායනික පොහොර නැවතීමට පියවර ගත් බවත් සඳහන් කරන ලදී.

තවද මේ වන විට කාබනික පොහොර යම් ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට අදාල පියවර ගනිමින් පවතින බවත්, ඒ සඳහා අප සහයෝගය ලබා දිය යුතු බවත්, සඳහන් කරන ලද අතර මේ වන විට රජය විසින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම වෙනුවෙන් හෝ කාබනික පොහොර මිලදී ගැනීම වෙනුවෙන් හෙක්ටයාරයකට රුපියල් 12,500 ක් බැගින් ගොවීන්ට ලබා දීමට කටයුතු කර ඇති බවත් රටට ආදරය කරන ජනතාවට ආදරය කරන අනාගත දරුවන්ට ආදරය කරන පිරිසක් ලෙස රටේ ගොවිජනතාව මේ වැඩසටහන සඳහා අන්තර්ග්‍රහණය විය යුතුම බවත් එසේ නොකරන්නේ නම් ඒ තුළින් බහු ජාතික සමාගම්වල පැවැත්ම බිඳහෙළීමට නොහැකි වන බවත් සාර්ථක හෝ සාර්ථක නොවන්නේද යන්න සිතනවාට වඩා මේ සඳහා අවතීර්ණ විය යුතු බවත් යම් අලාභයක් සිදුවුවහොත් රජය මඟින් එම අලාභයද ගෙවීමට සූදානම් බවත් සඳහන් කරන ලදී.

තවද ලෝක ආහාර සංවිධානය මඟින් මේ වසර දෙක තුළ මුළු ලෝකයේම ආහාර නිෂ්පාදනය 30% බිඳවැටී ඇති බවට සංඛ්‍යා ලේඛන තුළින් පෙන්වා ඇති බවත් ආනයනය කරනු ලබන ද්‍රව්‍ය මේ වනවිට අඩුවීම නිසා විශාල මිල වැඩිවීමක් සිදුවී ඇති බවත්, මේ සඳහා කාබනික පොහොර භාවිතා කරමින් බෝග නිෂ්පාදනය ඉතාම හොඳ වැඩපිළිවෙළක් බවත්, ප්‍රදේශයේ ආහාර සුරක්ෂිතභාවය වෙනුවෙන් ගෙන ඇති යෝජනාව ඉතාම කාලෝචිත බවත් සඳහන් කරමින් සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා තමන් ඉදිරිපත් කළ යෝජනාව ප්‍රායෝගික භාවිතයට ගැනීමේදී ගැටළු ලෙසට කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රමාණවත් පරිදි සිදු නොකිරීම හා පිටරටින් ගෙන්වන පොහොර සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාවය සඳහන් කළ හැකි සේම කාබනික පොහොර මිල දී ගැනීමට හෝ නිෂ්පාදනය කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් නොමැති වීම මේ සඳහා බලපාන ප්‍රධාන ගැටලුව බවට සඳහන් කරන ලදී

තවද මේ සඳහා බල ප්‍රදේශයේ තුළ එක් තෝරාගත් භූමියක් තුළ මිනිසුන් එක් රැස්කර ගනිමින් සභාවේ වගකීම රැගෙන කාබනික ගොවිතැන සඳහා යොමුවී ආදර්ශයක් සැපයීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරමුයි යන්නත් ඒ සඳහා ගරු සභාපතිතුමා ගේ කොට්ඨාශය තුළ තරියන්කුලම වැව ආසන්නයේ පවතින කුඹුරු ඉඩම් භාවිතා කළ හැකි බව ද කරුණු දක්වමින් සඳහන් කරන ලදී තවද මෙය අත්හදා බැලීමක් බැවින් මෙලෙස කුඩාවට ආරම්භ කර නිසි පරීක්ෂාවක් සිදු කරමු යන්න ප්‍රකාශ කරන ලදී.

තවද ගොවියාගේ ගැටළුව අප සාධාරණව දැකිය යුතු බවත් ඔවුන්ගේ මානසික මට්ටම් අප තේරුම් ගත යුතු බවත් ගරු සභාපතිතුමා ට මේ සම්බන්ධයෙන් අදහස් දැක්විය හැකි තැන් රාශියක් පවතින බැවින් ඊට අදාල මැදිහත් වීම සිදු කරන ලෙසත්, මේ සඳහා තිබෙන පොහොර ප්‍රමාණයෙන් වගා කිරීමටත් ඉතිරි ප්‍රමාණයෙන් කලින් පරිදි වගා කිරීමටත් ක්‍රමයෙන් කාබනික පොහොර භාවිතය

සඳහා යොමු වීමත් සිදු කළ යුතු බවත් ඒ සඳහා සභාව මගින් සිදුවිය යුතු මැදිහත්ව සිදු කරමුයි යන්න ප්‍රකාශ කරන ලදී.

අනතුරුව මේ සියලු කාරණා තුළ අපට අවශ්‍ය වූයේ ජනතාව මේ වන විට මුහුණ දී තිබෙන ගැටලුව සඳහා සභාවේ අවධානය යොමුකර ඒ සඳහා පක්ෂ පාට භේදයකින් තොරව විසඳුම් සොයා බලා අදාළ වැඩපිළිවෙල කඩිනමින් දියත් කරමුයි යන්නත් ඒ සඳහා සාධනීය අදහස් දැක්වූ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාටම ස්තූතිවන්ත වෙමින් සිය සමාලෝචන කතාව අවසන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අතිගරු ජනාධිපතිතුමා විසින් සෞභාග්‍යයේ දැක්ම තුලින් හරිත රාජයක් හා දේශයක් ඇති කළ යුතුයි යන සංකල්පයේ සිට කටයුතු කලත්, ඒ සම්බන්ධයෙන් මේ වනවිට රට තුළ ඇතිවී ඇති තත්ත්වය සම්පූර්ණයෙන් කුමන්ත්‍රණකාරී කෘමි නාශක හා පොහොර ඒකාධිකාරය විසින් ඇතිකර ඇති තත්ත්වයක් බවත්,කාබනික පොහොර සංකල්පය තුළ ගොවීන්ට වගා කටයුතු සිදු කිරීමේ නොහැකියාවක් නොමැති නමුත් පෙර කී ඒකාධිකාරිය විසින් හා විපක්ෂය විසින් ගොවියා තුළ වැරදි සංකල්පයක් ඇති කිරීමට කටයුතු කළ බවත් 1970 වර්ෂයේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට හරිත සංකල්පය ක්‍රියාත්මක කිරීමට යාමේදී ද මේ අයුරින් බාධක පැමිණ විපක්ෂය හා ජාත්‍යන්තර කුමන්ත්‍රණ හමුවේ ඇය ඡන්දයෙන් පරාජය වූ බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

පසුගිය දිනක කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා සමඟ පැවති සාකච්ඡාවේ දී ද වර්තමාන තත්ත්වය විමසන අවස්ථාවේදී රජයක් ලෙස මේ සම්බන්ධයෙන් කුමන තීන්දු තීරණ ගනු ලැබුවද එය බිම් මට්ටමෙන් ක්‍රියාත්මක නොවන බවටත් සෑම තුලානයකටම කෘෂිකර්මය සම්බන්ධයෙන් එක් රාජ්‍ය නිලධාරියෙකු කෘෂිකර්ම උපදේශක වරු සමෘද්ධි සංවර්ධන නිලධාරී ආදිය රාජ්‍ය නිලධාරීන් සිටින බවත්, ලෝකයක් ලෙස මුහුණ දී තිබෙන වසංගත තත්වය හමුවේ රජයක් හැටියට මුහුණදීම සඳහා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ගෙන ආ වැඩපිළිවෙළ එතුමා ක්‍රියාත්මක කරනවා වුවත් එතුමා පිළිබඳ ජනතාව තුළ පවතින ආකල්ප මේ වන විට වෙනස් කරමින් පවතින නමුත් ජනයා මෙම වැඩ පිළිවෙල අඛණ්ඩව සිදුකරන බවත් සඳහන් කරන ලදී.

තවද මෙරටට අවශ්‍ය පොහොර ගෙන්වීම සඳහා මිලියන ගණනක් වියදම් කළත් ගොවියන් සඳහා මෙම පොහොර සහනාධාරයක් ලෙස ලබාදුන් නමුත් කාබනික පොහොර රට තුළ නිෂ්පාදනය කරනවා නම් හෝ කාබනික පොහොර තුලින් වගා කටයුතු සිදුකරනවා නම් කිසිදු ගැටලුවකින් තොරව වියදම් කරන ලද මිලියන ප්‍රමාණය ඒ වෙනුවෙන් වියදම් කිරීමේ හැකියාව පවතින බවත් ගොවි ජනතාව තුළ ඇති කළ හැකි ආකල්ප මත හා රාජ්‍ය නිලධාරීන්ගේ අච්චිමත් වැඩපිළිවෙළ හමුවේ අසාර්ථක තත්වයකට අද මුහුණ දීමට සිදුවී ඇති බවත් සඳහන් කරන ලදී.

අනතුරුව මෙම යෝජනාව සමඟ වාර්තාව ජනාධිපතිතුමා වෙත යැවීමට කටයුතු කරන සේම ගරු මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව සම්බන්ධයෙන් අද සිටම ක්‍රියාත්මක වන බවත් සඳහන් කරන ලද අතර බල ප්‍රදේශයේ ඉඩම්වල කෝමාරිකා හෝ කුමන බෝගයක් වගා කලද මෙම සභාවේ අවසරයකින් තොරව බල ප්‍රදේශය පවතින ඉඩම් කිසිසේත්ම සමාගමක් වෙත පැවරීමට තමන් විරුද්ධ වන බව ප්‍රකාශ කරමින් යෝජනාව සම්බන්ධයෙන් විරෝධතා පවතින්නේද යන්න විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා විසින් ගෙන ආ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**02.** **මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී. කුමාරදාස මැතිතුමා 2021.10.08 වන දින පැවති මුදල් කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**I. මතක රඳවන ගබඩාවක් මිල දී ගැනීම**

කාර්යාලයේ දත්ත හා තොරතුරු එක් එක් නිලධාරීන්ගේ විෂය අනුව වෙන් වෙන් වශයෙන් තබා ගැනීම අත්‍යාවශ්‍ය වී ඇත. එම තොරතුරු පරිඝණකයේ තබා ගැනීමට තරම් පරිමාවක් නොමැති හෙයින් හා අමතරව තොරතුරු හා දත්ත රැස්කර තබා ගැනීම වැදගත් බැවින් මතක රඳවන ගබඩාවක් වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර, ඉදිරිපත් කරන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 09B1/448, මෛත්‍රිපාල සේනානායක මාවත, අනුරාධපුර ලිපිනයේ පිහිටි wifi Zone Compputer Technologies (Pvt) Ltd වෙතින් අවශ්‍ය මතක රඳවනය සම්පූර්ණ වටිනාකම රු 15,500 කට මිලදී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**II. ප්‍රාදේශීය සභාවට අයත් RB 8395 හා RD 9398 දරණ ට්‍රැක්ටර් රථ දෙක සඳහා අවශ්‍ය පිටුපස ටයර් මිලදී ගැනීම.**

ප්‍රාදේශීය සභාවට අයත් RB 8395 හා RD 9398 දරණ ට්‍රැක්ටර් රථ දෙකෙහි පිටුපස ටයර් මේ වන විට භාවිතා කල නොහැකි තත්වයෙන් ගෙවී ගොස් ඇති බැවින් ඒ සඳහා පහත සඳහන් ටයර් ප්‍රමාණ වලින් පිටුපස ටයර් 02 බැගින් මිල දී ගැනීම වෙළඳපල මිල සැදහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා සිදු කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

RB 8395 - ටයර් ප්‍රමාණය -12.4/11.00-28
RD 9398 - ටයර් ප්‍රමාණය -12.4 -28

**III. ප්‍රජා ශාලාව සඳහා ජල සම්බන්ධතාවය ලබා ගැනීම.**

මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 237 තුලානයේ පිහිටි උණගස්වැව ග්‍රාමයේ 2 වන පටුමඟෙහි ඉදි කර ඇති ප්‍රජා ශාලාවට ජලය ලබා ගැනීම සඳහා වූ 2021.07.20 වන දින පැවති මහ සභාවේ තීරණ අංක ඉ) 82 යටතේ ජල සම්පාදන මණ්ඩලය හරහා ලබා ගත් රු 23,614.00 ක ඇස්තමේන්තුව ප්‍රකාරව අදාල මුදල ගෙවා ජල සම්බන්ධතාවය ලබා ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**IV. ආදායමින් 1% මුදලක් ගෙවීම.**

මෙම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පිහිටි අංක 11/1 නාගසේන මාවත, අනුරාධපුර ලිපිනයේ පිහිටි ආලකමන්දා හොටෙල් මැනේජ්මන්ට් (පුද්) සමාගම සිය 2021 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍රය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේදි, 2020 වර්ෂයේ ආදායමින් 1% මුදල් ගෙවන ලෙසට සභාව විසින් දැනුම් දී ඇති නමුත් වර්ථමානයේ පවතින කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ හෝටලයේ ආදායම නොසිතූ ලෙස පහත වැටීම හේතුවෙන් ආදායම අවම මට්ටමක පවතින බවට සඳහන් කරමින්, 2021 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය මුදල් කොටස් වශයෙන් ගෙවීමට පහසුකම් සලසා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බැවින් පවතින තත්වය වෙනුවෙන් සහනයක් සැලසීම උදෙසා 2021 වර්ෂයේ වෙළඳ බලපත්‍රය ලබා දී අදාල මුදල 2021 දෙසැම්බර් මස 31 දිනට පෙර වාරික වශයෙන් ගෙවීම සඳහා පහසුකම් සලසා දීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**V. ජල සම්බන්ධතාවය ලබා ගැනීම සම්බන්ධවයි.**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කලත්තෑව මෙත්හිමි මාවත ලිපිනයේ පදිංචි ඩබ්.එම්.සී.කේ මැණිකේ මහත්මිය හා ඒ අවට ප්‍රදේශවාසී පවුල් 06 ක් ජීවත් වන පිරිස මීටර් 170 දිග මාර්ගය හරහා ජල නල එලීම සඳහා කාණු කපා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බැවින් ප්‍රාදේශීය සභාවට අයත් බැකෝ ලෝඩරය යොදවා අදාල මාර්ගයේ ජල නල එලීමට අවශ්‍ය කාණු කපා දීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**VI. ප්‍රාදේශීය සභාවට අයත්, ZA 5033 දරණ බැකෝ ලොඩරය සඳහා අවශ්‍ය බැටරි මිලදී ගැනිම.**

ප්‍රාදේශීය සභාවට අයත් ZA 5033 දරණ Foton වර්ගයේ FLB468 -11 B LOADER මාදිලියේ බැකෝ ලොඩරය සඳහා අවශ්‍ය ඇම්පියර් 120 වෝට් 12 ප්‍රමාණයේ බැටරියක් මිලදී ගැනිම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් ඇම්පියර් 120 වෝට් 12 ප්‍රමාණයේ බැටරියක් සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති 2052/123, වීරසේකරාරාම පාර, මාර්කට් පෙදෙස, අනුරාධපුර ලිපිනයේ පිහිටි මහනුවර ටයර් සෙන්ටර් වෙතින් සම්පූර්ණ වටිනාකම රු 29,590.00 කට මිලදි ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**VII. කුඩා නෙළුබැව තුලානයේ ප්‍රාදේශීය සභාවට අයත්, බ්ලොග් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය ඉදි කිරීමට අදාල භූමියේ ළිදක් ස්ථාපිත කිරීම**

කුඩා නෙළුබැව තුලානයේ ප්‍රාදේශීය සභාවට අයත්, බ්ලොග් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය ඉදි කිරීමට අදාල භූමිය තුල ළිදක් ස්ථාපිත කිරීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් Excaveter 200 පැයක් සඳහා ලබා ගැනීම වෙනුවෙන් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 103, බුද්ධගයා මාවත ලිපිනයේ පිහිටි සෙනෙවිරත්න කන්ස්ට්‍රක්ෂන් වෙතින් ලබා ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**VIII. 277 කලත්තෑව සේවා ස්ථානය ඉදිරිපිට මාර්ගයට බෝක්කුවක් දැමීම.**

277 කලත්තෑව සේවා ස්ථානය ඉදිරිපිට මාර්ගයට බෝක්කුවක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය අනුව සකස් කරනු ලැබූ රු 143,091.90 ක ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව ප්‍රකාරව අදාල ස්ථානයේ බෝක්කුව ඉදි කිරීම බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධානයක් හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනිමින් සිදු කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදි.

**IX. වැහි පීලි මිල දී ගැනීම**

ප්‍රාදේශීය සභාවට අයත් කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයේ වහලය වෙනුවෙන් අවශ්‍ය වැහිපීලි මිල දී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ප්‍රධාන වීදිය, අනුරාධපුර ලිපිනයේ පිහිටි මහජන හාඩ්වෙයාර් වෙතින් කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයේ වහලයට අවශ්‍ය වැහි පීලි අඩි 65 ක ප්‍රමාණය සම්පූර්ණ වටිනාකම රු 27,625.00 මුදලකට මිලදී ගැනීම සඳහා මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**X. මල් පැල මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභා භූමිය අලංකාර කර ගැනීම සඳහා අවශ්‍ය මල් පැල මිල දී ගැනීමට අදාලව ලබා ගත් මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කරන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සමරපුර, අනුරාධපුර ලිපිනයේ පිහිටි රෝයල් ප්ලාන්ට් නර්සරි වෙතින් කාර්යාලයට අවශ්‍ය මල් පැළ මිල දී ගැනීම සම්පූර්ණ වටිනාකම රු 12,300 ක් යටතේ සිදු කිරීම සඳහා මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

### XI. පෙට්ටි බෝක්කුවක් ස්ථාපනය කිරීම.

275 කවරක්කුලම ලී මෝල පාර ශ්‍රී විභූති ගම්මානයට පිවිසෙන හරස් මාර්ගයට පෙට්ටි බෝක්කුවක් ස්ථාපනය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති රු. 489,328.52 ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව ප්‍රකාරව බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධානයක් හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් අදාල පෙට්ටි බෝක්කුව ඉදි කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

### XII. අබලි වාහන විකුණා දැමීම.

ප්‍රාදේශිය සභාවට අයත්, භාවිතයෙන් ඉවත් කරන ලද පහත සඳහන් අබලි වාහන විවෘත ලංසු කැඳවීම මගින් විකිණීම සිදු කිරීමට අදාල ප්‍රසම්පාදන දැන්වීම මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

| වාහන අංකය | වාහන පංතිය | වර්ගය | වාහන අංගනය |
|---|---|---|---|
| 252-6483 | DualPurpose Vehicle | Mitsubishi | නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශිය සභාවේ වාහන අංගනය |
| NC LF 4799 | Bolero Load Carrier | Mahindra | නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශිය සභාවේ වාහන අංගනය |

### XIII. ප්‍රාදේශිය සභාවේ සංවර්ධන කටයුතු වෙනුවෙන් අවශ්‍ය ගල් රෝල මිල දී ගැනීම.

ප්‍රාදේශිය සභාවේ සංවර්ධන කටයුතු වෙනුවෙන් අවශ්‍ය ටොන් 08 ප්‍රමාණයේ ගල් රෝලක් මිල දී ගැනීම සඳහා වූ යෝජනාව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඊට අදාල තාක්ෂණික පිරිවිතරය සකස් කර පුවත්පතෙහි පල කරමින් අදාල ප්‍රසම්පාදන කාර්යය සිදු කිරීම සඳහා මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

### XIV. දියර පොහොර මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම.

ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පොහොර අවශ්‍යතාවය සපුරාලීම උදෙසා බල ප්‍රදේශයට අයත්, 280 තරියන්කුලම ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ ප්‍රාදේශිය සභාවට අයත් භූමිය තුල ඉදි කිරීමට යෝජිත දියර පොහොර සකස් කිරීමේ මධ්‍යස්ථානය වෙනුවෙන් මාස්ටර් ප්ලෑනක් සකස් කර සභා ගත කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

### XV. ප්‍රාදේශිය සභාවට අයත් වාහන සේවා මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ෆිල්ටර්ස් මිල දී ගැනීම.

ප්‍රාදේශිය සභාවට අයත්, වාහන සේවා මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ෆිල්ටර්ස් මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර 2021.09.09 වන දින පැවති මුදල් කමිටුවේ තීරණ අංක 03 යටතේ මෙම ෆිල්ටර්ස් මිල දී ගැනීම සඳහා අවම වශයෙන් මිල ගණන් 05 ක් කැඳවීමට තීරණ කර නමුත් කැඳවන මිල ගණන් අතරින් මිල ගණන් 03 ක් පමණක් ලැබී තිබුණ අතර ලැබී ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති 561/87, පොළ පාර, 3 වන හරස් වීදිය, අනුරාධපුර ලිපිනයේ පිහිටි තරුෂි මෝටර්ස් වෙතින් අවශ්‍ය ඔයිල් ෆිල්ටර්ස් හා ඩීසල් ෆිල්ටර්ස් මිල දී ගැනීම සඳහා මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> 2021.10.08 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ගෙන ආ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**03. 2021 නොවැම්බර් මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021 නොවැම්බර් මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**2021 නොවැම්බර්**

| | | පැය ගණන |
|---|---|---|
| 01. එච්.එම්.එස්.ඩී චන්ද්‍රසිරි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |
| 03. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 04. කේ.ජී.ඒ සම්මානි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 05. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 06. ඩී.පී.ඩී.එන් එල් විජේසිරි මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 07. ටී.එච්.ආර් තාරක මයා | (කළ සහකාර (ආවරණ) | 40 |
| 08. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහායක) | 40 |
| 09. එස්.පී.එම් මානෙල් පුෂ්පකුමාරි මිය | (පුස්තකාල සහායක) | 40 |
| 10. ඒ.ඒ පියතිස්ස මයා | (මං.කම්කරු (මුරකරු ආවරණ) | 40 |
| 11. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 40 |
| 12. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 13. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 14. සුභාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 40 |
| 15. පියල් බුද්ධික මයා | (අනියම් මාර්ග කම්කරු) | 40 |
| 16. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 75 |

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා නෙළුබැව ජල පිරිපහදු මධ්‍යස්ථානයේ සේවයේ යොදවා සිටින ඒ.ඒ පියතිස්ස මහතා වෙත ලබා දෙන අතිකාල ප්‍රමාණය පිළිබඳව අවධාවනය යොමු කරන ලෙස ඉල්ලා සිටිමින් 2021 නොවැම්බර් මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාල සේවකයා සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව සඳහන් කරමින් අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සම්බන්ධව යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2021 නොවැම්බර් මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**04. නාගරික සංවර්ධන අධිකාරියේ සැළසුම් හා සංවර්ධන රෙගුලාසි 2022**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 වර්ෂය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිය අධිකාරියේ සැළසුම් හා සංවර්ධන රෙගුලාසි ගැසට් කර ඇති බව ප්‍රකාශ කරමින් ඊට අදාල ගැසට් පත්‍රය සභාවට ඉදිරිපත් කරන ලද අතර අදාල චක්‍රලේඛය ප්‍රකාරව අයදුම්පත්‍රයේ සිට ගාස්තු පැනවීම දක්වා වෙනස් කිරීම සුදුසු බවටත් ඒ අනුව ගාස්තු පැනවීම 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා ගැසට් පත්‍රයේ පල කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් නාගරික සංවර්ධන අධිකාරියේ සැළසුම් හා සංවර්ධන රෙගුලාසි 2022 ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා ප.ව 1.46 සභා ගර්භයෙන් පිටව යන ලදී.

**05. 2022 වර්ෂය සඳහා ගාස්තු පනවා අය කිරීමේ ගැසට් පත්‍රයේ කෙටුම්පත අනුමත කිරීම**

**1. 2022 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීමට අදාල වාර්ෂික වෙළඳ බලපත්‍ර ගාස්තු අය කිරීම පහත සඳහන් පරිදි සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| | **1 වන තීරුව** | **ii වන තීරුව** | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **ස්වාභාවය** | **පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම** | | | | | |
| | | **රු. 750.00 නොයික්මවන අවස්ථාවක.** | | **රු. 750.00 ඉක්මවන එහෙත් රු.1500.00 නොයික්මවන අවස්ථාවක.** | | **රු. 1500.00 ඉක්මවන අවස්ථාවක.** | |
| | | **රු.** | **ශත** | **රු.** | **ශත** | **රු** | **ශත** |
| 01 | ලැඟුම් නිවාසයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 02 | හෝටලයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 03 | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 04 | ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 05 | තේ කඩයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 06 | කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 07 | බේකරියක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 08 | කිරිපට්ටියක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 09 | කිරි විකිණීම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 10 | මාළු විකිණීම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 11 | මස් විකිණීම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 12 | සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 13 | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 14 | ගවගාලක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 15 | පෞද්ගලික වෙළදපොලක් පවත්වාගන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 16 | කොණ්ඩා කැපීමේ සැලුන්පලක් පවත්වාගන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 17 | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 18 | ගෝඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 19 | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |

එසේ වුවද යම් පරිශ්‍රයක් හෝටලයක් ආපන ශාලාවක් හෝ නවාතැන්පලක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නා වුවද 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා එම හෝටලය,ආපන ශාලාව හෝ නවාතැන් පලක් ලෙස ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද,අනුමත කර හෝ පිළිගත්තා වූ ද,අවස්ථාවක බලපත්‍ර ගාස්තු 2022 වර්ෂයේ ඒ හෝටලයේ ආපන ශාලාවේ හෝ නවාතැන් පලෙහි ආදායමෙන් 1% ක් විය යුතුය.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> 2022 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම ගරු සභාපතිතුමා සඳහන් කල පරිදී සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ ඒකඟතාවයෙන් සභා සම්මත විය.

## 2. 2022 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම පහත සඳහන් පරිදි සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| | **1 වන තීරුව** | **11 වන තීරුව** | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **ස්වභාවය** | **පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම** | | | | | |
| | | **රු.750.00 නොඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරීම රු.500.00 සීමාව)** | | **රු.750.00 ඉක්මවන එහෙත් රු.1500.00 නොඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරීම රු.750.00 සීමාව)** | | **රු.1500.00 ඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරීම රු.1000.00 සීමාව)** | |
| | | රු. | ශත | රු. | ශත | රු. | ශත |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | සම්භාණ්ඩ අළුත් වැඩියාව | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 02 | ටේලර් සාප්පු | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 03 | චිත්කලය | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 04 | සබන් නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 05 | පපඩම් නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 06 | යෝගට් නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 07 | නූඩ්ලස් නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 08 | ගඩොල් නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 09 | කොහු ඉදල් නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 10 | බෑග් නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 11 | අයිස්ක්‍රීම් නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 12 | කුළු බඩු නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 13 | රසකැවිලි,නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 14 | නිමි ඇඳුම් නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 15 | සම්භාණ්ඩ නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 16 | බිම්මල් නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 17 | වඩු මඩුව | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 18 | හඳුන්කූරු නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 19 | තේ කුඩු නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 20 | කිරි ආශ්‍රිත නිෂ්පාදන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |

<u>ගරු මන්ත්‍රී කේ.ජී ශාන්ත මැතිතුමා</u> 2022 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම ගරු සභාපතිතුමා සඳහන් කල පරිදී සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂයට කර්මාන්ත බදු පැනවීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**3. 2022 වර්ෂයට අන්තරාදායක ව්‍යාපාර සහ අප්‍රසන්න ව්‍යාපාර සඳහා ගාස්තු අය කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයට අන්තරාදායක ව්‍යාපාර සහ අප්‍රසන්න ව්‍යාපාර සඳහා ගාස්තු අය කිරීම. පහත සඳහන් පරිදි සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| | **1 වන තීරුව** | **11 වන තීරුව** | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **ස්වභාවය** | **පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම** | | | | | |
| | | **රු.750.00 නොඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරිම රු.500.00 සීමාව)** | | **රු.750.00 ඉක්මවන එහෙත් රු.1500.00 නොඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරිම රු.750.00 සීමාව)** | | **රු.1500.00 ඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරිම රු.1000.00 සීමාව)** | |
| | | රු. | ශත | රු. | ශත | රු. | ශත |
| 01 | ඉන්ධන පිරවුම්හල් | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 02 | පොල් ලේලි වලවල් කර්මාන්ත | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 03 | කෘමිනාශක නිෂ්පාදනය | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 04 | පැස්සුම් ස්ථාන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 05 | වෙඩි බෙහෙත් ගබඩා කරන ස්ථාන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 06 | ගෑස් සිලින්ඩර ගබඩා කිරිම හා | 500 | 00 | 750 | 00 | 1000 | 00 |

| | විකිණීම | | | | | | |
|---|---|---|---|---|---|---|---|

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා 2022 වර්ෂයට අන්තරාදායක ව්‍යාපාර සහ අප්‍රසන්න ව්‍යාපාර සඳහා ගාස්තු අය කිරීම ගරු සභාපතිතුමා සඳහන් කල පරිදි සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂයට අන්තරාදායක ව්‍යාපාර සහ අප්‍රසන්න ව්‍යාපාර සඳහා ගාස්තු අය කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**4. 2022 වර්ෂය සඳහා වාහන හා සත්ව බද්ද පැනවීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයට වාහන හා සත්ව බද්ද පැනවීම පහත සඳහන් පරිදි සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| වාහන හා සත්ත්ව බද්ද | රු. ශත. |
|---|---|
| මෝටර් රථයක්,මෝටර් බයිසිකලයක්, මෝටර් ලොරියක්,රික්ෂෝවක්,කරත්තයක්,බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම | 25. 00 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ කරත්තයක් සඳහා | - |
| අ).වෙළඳ කාර්යන් සඳහා යොදවන්නේ නම් | 18. 00 |
| ආ).වෙළඳ කාර්යන් සඳහා නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4. 00 |
| සෑම කරත්තයක් සඳහා | 20. 00 |
| සෑම අත්කරත්තයක් සඳහා | 10. 00 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7. 50 |
| සෑම අශ්වයකු පෝනියෙකු හෝ කොටළුවකු සඳහා | 15. 00 |
| සෑම ඇතෙකු සඳහා | 50. 00 |

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා 2022 වර්ෂයට වාහන හා සත්ව බද්ද පැනවීම ගරු සභාපතිතුමා සඳහන් කල පරිදී සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂයට වාහන හා සත්ව බද්ද පැනවීම යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**5. 2022 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම පහත සඳහන් පරිදි සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| 1 වන තීරුව | 11 වන තීරුව |
|---|---|
| වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම | අය කරනු ලබන මුදල රුපියල් |
| රු. 6000.00 නොයික්මවන අවස්ථාවක | කිසිවක් නැත |

| | |
|---|---|
| රු.6000.00 ඉක්මවන එහෙත් රු.12000.00 නොයික්මවන අවස්ථාවක | 90.00 |
| රු.12000.00 ඉක්මවන එහෙත් රු.18750.00 නොයික්මවන අවස්ථාවක | 180.00 |
| රු.18750.00 ඉක්මවන එහෙත් රු.75000.00 නොයික්මවන අවස්ථාවක | 360.00 |
| රු.75000 .00 ඉක්මවන එහෙත් රු.150000.00 නොයික්මවන අවස්ථාවක | 1200.00 |
| රු.150000.00 ඉක්මවන අවස්ථාවක | 3000.00 |

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා 2022 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම ගරු සභාපතිතුමා සඳහන් කල පරිදි අය කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**6. 2022 වර්ෂයට විනෝද බදු පැනවීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 1984 අංක 27 දරන විනෝද බදු (සංශෝධිත) පනතින් සංශෝධිත 1964 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ ප්‍රකාශිත සියලු විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 15% ක විනෝද බද්දක් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පනවා අය කිරීමට 1964 අංක 12 දරණ විනෝද බදු ආඥා පනතේ 2(1) වගන්තියේ සඳහන් විධි විධාන ප්‍රකාරව සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ගරු සභාපතිතුමා සඳහන් කල පරිදි 2022 වර්ෂය වෙනුවෙන් විනෝද බදු පැනවීම සුදුසු බවට කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂයට විනෝද බදු පැනවීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**7. 2022 ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකිරීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි වගන්තියෙන් පැවරි ඇති බලතල ප්‍රකාර 1988- 08-23 වැනි දින අංක 520/07 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළාත් පාලන,නිවාස හා ඉදි කිරීම් ගරු අමාත්‍යතුමා අනුමත කර ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරයක පිලිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධි විධාන ප්‍රකාර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා සීමාව තුල යම් වීදියකට/පාරකට/ඇලකට/මුහුදට හෝ අහසට පෙනෙන පරිදි වර්ග අඩියකට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරිමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උප ලේඛනයේ සඳහන් පරිදි අය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| | | | |
|---|---|---|---|
| දැන්වීම් පුවරු | I. | ඩිජිටල් දැන්වීම් පුවරු (ව.මී.1 කට) | රු. 2,500.00 |
| | II. | ඩිජිටල් නොවන දැන්වීම් පුවරු (ව.මී.1 කට) | රු.1,500.00 |
| | III. | නාම පුවරු (ව.මී.1 කට) | රු. 500.00 |
| | IV. | මාර්ගයට ඉහළින් මාර්ගය හරහා පවතින දැන්වීම් පුවරු (Gentries)(ව.මී.1 කට) | රු.1,000.00 |

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ගරු සභාපතිතුමා සඳහන් කල පරිදි 2022 වර්ෂය වෙනුවෙන් ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම සුදුසු බවට කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**8. 2022 වර්ෂයට ගාස්තු පනවා අය කිරීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 වර්ෂයට ගාස්තු පනවා අය කිරීම පහත සඳහන් පරිදි සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| | | |
|---|---|---|
| 1. ත්‍රී රෝද රථ කුලී - වාර්ෂික | - | රු. 250.00 |
| 2. අනුකූලතා අයදුම්පත්‍ර ගාස්තු | - | රු. 300.00 |
| 3. අනුකූලතා පරීක්ෂණ ගාස්තු | - | රු. 1000.00 |
| 4. අනු බෙදුම් / මිනින්දෝරු අයදුම්පත්‍ර ගාස්තු | - | රු. 300.00 |
| 5. අනු බෙදුම් / මිනින්දෝරු පරීක්ෂණ ගාස්තු | - | රු. 1000.00 |
| 6. ගොඩනැගිලි සැලසුම් අයදුම් පත්‍ර ගාස්තුව | - | රු. 500.00 |
| 7. ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තු | - | රු. 1000.00 |
| 8. ගොඩනැගිලි සැලසුම් අලුත් කිරීම ගාස්තුව | - | රු. 500.00 |
| 9. දීර්ඝ කාලීන බදු බලපත්‍ර අනුමත ගාස්තු | - | රු. 600.00 |
| 10. එම පරීක්ෂණ ගාස්තුව | - | රු. 400.00 |
| 11. වීථි රේඛා හා නොපරවා ගැනීමේ අනුමත ගාස්තු | - | රු. 1000.00 |
| 12. එම පරීක්ෂණ ගාස්තු | - | රු. 400.00 |
| 13. ව්‍යාපාර ලියාපදිංචි නිර්දේශිත ගාස්තුව | - | රු. 400.00 |
| 14. ව්‍යාපාර ලියාපදිංචි පරීක්ෂණ ගාස්තු (ස්ථානීය පරීක්ෂාව) | - | රු. 400.00 |
| 15. සභාව සතු භූමි යම් කටයුත්තට ලබා දීම සඳහා ගාස්තුව දිනකට | - | රු . 500.00 |
| 16. සුසාන භූමි ගාස්තුව ආදාහන හා භූමිදාන (සාමාන්‍ය) | - | රු. 500.00 |
| 17. සුසාන භූමි ගාස්තුව - තැන්පත් කිරීම සඳහා වර්ග අඩි 1 කට | - | රු. 100.00 |
| 18. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව | - | රු. 1000.00 |
| 19. එම අයදුම්පත්‍ර සඳහා | - | රු. 500.00 |
| 20.ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග වල බොරළු ප්‍රවාහනය සඳහා ගාස්තු අය කිරීම( කියුබ් එකකට) | - | රු. 100.00 |
| 21.වැලි කැණීම්,බොරළු කැණීම්,පස් කැණීම් නිර්දේශය ලබා දීමේ ගාස්තුව | - | රු. 2000.00 |
| 22.නළ ළිං තැන්පත් මුදල (එක් වර්ෂයකට) | - | රු. 200.00 |
| 23.ජී.අයි බට එකක් එක් දිනක් සඳහා | - | රු. 20.00 |
| 24.පුද්ගලික ජල සැපයුම් සඳහා මාර්ග පළුදු කිරීම් ගාස්තු (බොරළු) | - | රු. 1000.00 |
| 25.පුද්ගලික ජල සැපයුම් ලබාගැනීම සඳහා තාර / කොන්ක්‍රීට් හා ඉන්ටර්ලොක් මාර්ග හරහා ජල සැපයුම් ලබා ගැනීම | - | රු. 3500.00 |
| 26.පුස්තකාල ඇප තැන්පත් මුදල | - | රු. 50.00 |
| 27.අතුරුවැල්ල සති පොල එක් වෙළඳ කුටියක් සඳහා | - | රු. 100.00 |
| 28.කොම්පෝස්ට් පොහොර අලෙවිය සිල්ලර මිල එක් කිලෝවකට | - | රු. 10.00 |
| 29.ට්‍රැක්ටර් ජල බවුසරය එක් දිනක් සඳහා (ජලය නොමැතිව) | - | රු. 6000.00 |

I. එක් ජල බවුසරයක් සඳහා ප්‍රාදේශීය සභා භූමියේ සිට කිලෝමීටර් අටක් ඇතුලත(ජලය නොමැතිව) - රු. 1500.00

II. එක් ජල බවුසරයක් සඳහා ප්‍රාදේශීය සභා භූමියේ සිට කිලෝමීටර් අටක් ඇතුලත(ජලය සහිතව) - රු. 2000.00

III. එම දුර ප්‍රමාණය ඉක්මවන විට එක් කිලෝමීටරයක් සඳහා - රු. 35.00

30.ට්‍රැක්ටරය ට්‍රේලර් වැඩ එක්දිනක් සඳහා - රු. 5000.00

31.කොන්ක්‍රීට් පරීක්ෂණ කුට්ටි (මෝල්ඩ්) එක් දිනකට කුලියට ලබාදීම - රු. 150.00

32.ට්‍රැක්ටරය ගලි බවුසරය

I. පළමු ගමන් වාරය සඳහා - රු. 5846.00
II. සේවක දිරි දීමනා - රු. 400.00
III. දෙවන ගමන් වාරය සඳහා - රු. 5346.00
IV. සේවක දිරි දීමනා - රු. 400.00
V. තෙවන ගමන් වාරය සඳහා - රු. 4846.00
VI. සේවක දිරි දීමනා - රු. 400.00
VII. ඉන්පසු සෑම ගමන් වාරයක් සඳහාම රු.4846.00 බැගින් අයකෙරේ.
VIII. එම කාර්යය වෙනුවෙන් කාර්යාලයේ සිට අදාල ස්ථානයට යෑම් ඊම් වෙනුවෙන් එක් කිලෝ මීටරයකට රු.35 බැඟින් අයකෙරේ.

33.බැකෝ ලෝඩර් යන්ත්‍රය කුලියට ලබා දීම මීටර් පැයක් සඳහා ගාස්තුව - රු. 3000.00

34.කොන්ත්‍රාත් සමිති ලියාපදිංචි කිරීමේ ගාස්තුව - රු. 1000.00

35.එක් කර්මාන්තයක් සඳහා අයදුම් පත්‍ර ගාස්තුව - රු. 500.00

36.ටිපර් රථය (කියුබ් 2.75 )දිනකට පැය 06 ක් ඉන්ධන සහිතව ලබා දීම සඳහා (ධාවන දුර 75km ඇතුලත) - රු.15000.00

I. එම දුර ප්‍රමාණය ඉක්මවන විට එක් කිලෝමීටරයක් සඳහා - රු. 150.00
II. ටිපර් රථය (කියුබ් 2.75 ) 5km ඇතුලත එක් ගමන් වාරයක් සඳහා - රු. 2500.00
III. එම දුර ප්‍රමාණය ඉක්මවන විට එක් කිලෝමීටරයක් සඳහා - රු. 150.00

37.කෘ කැබ් රථය ආරම්භක ගාස්තුව 5km ඇතුලත එක් ගමන් වාරයක් සඳහා - රු. 1500.00

I. එම දුර ප්‍රමාණය ඉක්මවන විට එක් කිලෝමීටරයක් සඳහා - රු. 35.00

38.සංචාරක වෙළදාම(බල ප්‍රදේශයේ මාර්ග වල සංචාරක වෙළදාම් ව්‍යාපාර කටයුතු වල නිරත ව්‍යාපාරිකයින්ගෙන් ගාස්තු අයකිරිම. - රු. 3000.00

39.තුරුලිය සෙවණ නිවාඩු නිකේතනය

I. වායු සමීකරණ කල කාමර දිනකට - රු. 1800.00
II. සාමාන්‍ය කාමර දිනකට - රු. 1200.00

ඉහත සේවාවන් සඳහා 10% ක සේවා ගාස්තුවක් අයකරනු ලැබේ.

40.ජයබිම උත්සව ශාලාව

I. මංගල උත්සව සඳහා ශාලාව ලබාදීම - රු.10000.00

පුටු 100ක් සමහ(අමතර පුටුවක් සඳහාරු.10.00 බැගින් අය කෙරේ)

II. වෙනත් රුස්වීම් වැඩමුළු විවිධ ප්‍රසංග සඳහා දිනකට පුටු 100 ක් සමග - රු. 6000.00 (අමතර පුටුවක් සඳහා රු.10.00 බැගින් අය කෙරේ)
III. ශබ්ද වාහිනි යන්ත්‍ර ලබා ගන්නේනම් අමතරව - රු. 1000.00
IV. නිදන කාමර යුගල - රු. 1000.00
V. නිදන කාමර සමුහ - රු. 2500.00
VI. ප්‍රභූ අට්ටාල 01ක් - රු. 750.00
VII. මංගල උත්සව භාණ්ඩ (පෝරුව,ශාලා,සැරසිලි,සෙට්බැක්,මේස සැරසිලි හා වෙනත් සැරසිලි සැපයීම පවතින මිල ගණන් අනුව ලබාදේ)
VIII. 100 දෙනෙක් සඳහා.බුෆේ සෙට් සමග දිවා ආහාර කට්ටලයක් - රු.2500.00

(අවශ්‍යනම් මුළුතැන් ගෙය භාවිතා කල හැක)

IX. 100 දෙනෙක් සඳහා තේ සැපයීම මුළුතැන්ගෙය භාවිතය සමග - රු. 2000.00
X. මල්ටිමීඩියා - රු. 3000.00

XI. කිරි තේ 01ක් නවාතැන් පහසුකම් ලබන්නන් සඳහා - රු. 50.00

XII. ඉහත විස්තර වලට අමතරව අවශ්‍යතාවයන් පවතින මිල ගණන් වලට සපයනු ලැබේ. ඉහත සේවාවන් සඳහා 10% ක සේවා ගාස්තුවක් අයකරනු ලැබේ.

41. සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම හා කාලය දීර්ඝ කිරීම සඳහා වන පෙරසැරි ගාස්තු.

| සංවර්ධන කාර්යයේ ස්වභාවය | අයකල යුතු ගාස්තු | |
|---|---|---|
| | **ඉඩමේ ප්‍රමාණය ව.මී** | **පෙරසැරි ගාස්තු** |
| 01. ඉඩම් අනුබෙදුම් සඳහා | ව.මී.150 >ව.මී.300 | කැබලි 1ක් සඳහා රු.1000.00 |
| | ව.මී.300 > ව.මී. 600 | කැබලි 1ක් සඳහා රු.800.00 |
| | ව.මී.600 > ව.මී. 900 | කැබලි 1ක් සඳහා රු.600.00 |
| | ව.මී.900 ට වැඩි | කැබලි 1ක් සඳහා රු.500.00 |
| 02.මායිම් තාප්ප / රුදවුම් බැම් ඉදිකිරීම | දික් මීටර් 01 ක් සඳහා | රු.100.00 |
| 03.සන්නිවේදන කුළුණු / ඇන්ටනා කුළුණු /සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම | රු.40000.00 | |
| 04.ඉන්ධන පිරවුම් හල් / වාහන සේවා ස්ථාන /දුම් පරික්ෂා කරන ස්ථාන | ව.මී. 1 කට | රු.100.00 |

42. ඉදිකිරිම් පෙරසැරි ගාස්තු.

| | | | |
|---|---|---|---|
| | **ගෙබිම් ප්‍රමාණය** | | **ගාස්තුව** |
| 01.ගොඩනැගිලි ඉදිකිරීම සඳහා | *I.* | ව.මී 400 දක්වා | රු. 5000.00 |
| | *II.* | ව.මී 400 > ව.මී 500 | රු.10000.00 |
| | *III.* | ව.මී 500 > ව.මී 750 | රු. 25000.00 |
| | *IV.* | ව.මී 750 > ව.මී 1000 | රු. 50000.00 |
| | *V.* | ව.මී. 1000 ට වැඩි | රු. 50000.00 + ව.මී 1000 වැඩි වන සෑම ව.මී. 100 ක් සඳහාම හෝ ඉන් කොටසකටම රු. 500.00 බැගින් |

43. කසල බඳු අය කිරීම.

ගෘහ ඒකකයක් සඳහා මාසයකට රු.100.00 ක මුදලක් අය කෙරේ. ගෘහ ඒකකයක් නොවන ස්ථාන සඳහා ඇස්තමේන්තු කරන ලද මුදලක් අය කෙරේ.

44. වාහන සේවා මධ්‍යස්ථානයේ ගාස්තු අය කිරීම.

| වාහන වර්ගය | මිළ ගණන් | | | |
|---|---|---|---|---|
| | **Body wash** | **Vacuum** | **Penetration oil** | **එකතුව** |
| කුඩා ප්‍රමාණයේ මෝටර් රථ (Maruti ,Alto, viva elite, Panda, Renult Kwid) | 350.00 | 200.00 | 300.00 | 850.00 |
| මධ්‍ය ප්‍රමාණයේ මෝටර් රථ (vitz, Aqva , Honda ,Wagan R) | 375.00 | 225.00 | 325.00 | 925.00 |
| විශාල ප්‍රමාණයේ මෝටර් රථ (Honda ,Grase , Civic, BMW, Volvo, Audi) | 400.00 | 250.00 | 350.00 | 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| වෑන් (KDH,Noha,Dolphine) | 500.00 | 400.00 | 450.00 | 1,350.00 |
| කැබ් (Navara, Hilux, Bolero) | 400.00 | 300.00 | 350.00 | 1,050.00 |
| ජීප් (V8. Sahara, Montero) | 700.00 | 500.00 | 400.00 | 1,600.00 |
| මධ්‍ය ප්‍රමාණයේ බස් | 800.00 | 1,000.00 | 900.00 | 2,700.00 |
| විශාල ප්‍රමාණයේ බස් | 1,000.00 | 1,500.00 | 1,350.00 | 3,850.00 |
| ටිපර් කියුබ් 01 | 700.00 | | 800.00 | 1,500.00 |
| ටිපර් කියුබ් 02 | 800.00 | | 900.00 | 1,700.00 |
| ටිපර් කියුබ් 03 | 1,500.00 | | 1,350.00 | 2,850.00 |
| 10 wheel ටිපර් කියුබ් 05 | 1,750.00 | | 1,500.00 | 3,250.00 |
| ට්‍රැක්ටර් | 400.00 | | 350.00 | 750.00 |
| ටේලර් 2 wheel | 400.00 | | 350.00 | 750.00 |
| යතුරු පැදි | 200.00 | | 100.00 | 300.00 |
| ත්‍රිවිල් | 350.00 | | 150.00 | 500.00 |

45.පෙර පාසල් ගාස්තු

| | |
|---|---|
| මාසික ගාස්තුව | 1600.00 |
| සේවා ගාස්තුව | 160.00 |
| ඇතුළත් වීමේ ගාස්තු | 1,500.00 |

46.දිවා සුරකුම් මධ්‍යස්ථානයේ ගාස්තු

| වයස | මුදල |
|---|---|
| මාස 07- අවු.2 දක්වා | 10,000.00 |
| අවු 02- 03 දක්වා | 6,000.00 |
| පෙර පාසල් දරුවන්(හවස්වරුව සඳහා පමණක්) | 3,000.00 |
| පාසල් යන දරුවන්(හවස්වරුව සඳහා පමණක්) | 2,500.00 |

| | |
|---|---|
| ඇතුළත් වීමේ ගාස්තු | 2,000.00 |

I. පාසල් නිවාඩු කාලයේ දී සම්පූර්ණ දිනය සඳහා දිවා සුරකුම් මධ්‍යස්ථානය භාවිතා කරන පෙර පාසල් දරුවන්,පාසල් දරුවන් ගෙන් මාසයකට රු.4, 500.00 ක ගාස්තුවක් අය කෙරේ.

II. මෙයට අමතරව සෑම මසකම මෙම එක් දරුවෙකු සඳහා සේවා ගාස්තුවක් ලෙස රු.100.00 අය කෙරේ.

47.බ්ලොක් ගල් සඳහා ගාස්තු

| | | |
|---|---|---|
| බ්ලොක් ගල් 1ක් ප්‍රවාහනය සහිතව | රු.49.00 | වෙළඳපොළ මිල ගණන් අනුව |
| බ්ලොක් ගල් 1ක් ප්‍රවාහනය රහිතව | රු.47.00 | මෙම මිල ගණන් වෙනස් විය හැක. |

48.ජයබිම උත්සව ශාලාවේ හා සභා භූමියේ පවත්වාගන යනු ලබන ජල පිරිපහදු මධ්‍යස්ථානයේ ජල ලීටරයක් රු.1.50 මිලකට විකිණීම සිදුකරනු ලබයි.

49. ප්‍රාදේශීය සභාවට අයත් පොදු වැසිකිලි ගාස්තුව - රු. 20.00

50.මෙම සභාවට අයත් කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානය තුල මිලදී ගනු ලබන සෑම එළවළු එක් කිලෝවක් සඳහා රු.2.00 ක මිලක්ද , ආර්ථික මධ්‍යස්ථානයෙන් විකුණනු ලබන සෑම එළවළු එක් කිලෝවක් සඳහාම රු.2.00 ක මිලක්ද සභාව විසින් අයකරනු ලබයි.

51.තණකොළ කපන යන්ත්‍රය කුලී පදනමට ලබා දීම වැඩකරන පැයක් සඳහා රු.2000.00 ප්‍රවාහන ගාස්තුව කිලෝමීටර් 1ක් සඳහා රු.35.00

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> 2022 වර්ෂයේ ගාස්තු පනවා අය කිරීම ගරු සභාපතිතුමා සඳහන් කල පරිදි සිදු කිරීම සුදුසු බවට ප්‍රකාශ කරමින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂයට ගාස්තු පනවා අයකිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> ප්‍රාදේශීය සභාවට බදු ගෙවන ව්‍යාපාරිකයන් වෙනුවෙන් අප පෙනී සිටිය යුතු බව ප්‍රකාශ කරමින් සංචාරක ව්‍යාපාරිකයන් වර්ගීකරණයකට ලක් වී නොමැති නමුත් ස්ථාවර ගොඩනැගිනල්ලක් තුල වෙළඳ ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබන පුද්ගලයින් අනිවාර්යෙන් වර්ෂයට අදාල බදු මුදල් ගෙවමින් ව්‍යාපාර කටයුතු සිදු කරගෙන ගියා වුවත්, රු 3000 ක මුදලක් පමණක් ගෙවන සංචාරක වෙළඳුන් බල ප්‍රදේශය පුරාම ගොස් සිය ආදායම ලබා ගන්නා බවත්, ඒ සම්බන්ධයෙන් ගැටළුවක් පවතින් බැවින් එම මුදල දෛනිකව අය කර ගැනීමට අදාල පියවර ගැනීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

**06. 2022 වර්ෂය සඳහා ස්ථානීය බදු දීම්**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022 වර්ෂය සඳහා ස්ථානීය බදු දීම් සම්බන්ධයෙන් මීට ඉහතදී ඉදිරිපත් වූ යෝජනාව සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මෙතෙක් හිමි වී නොමැති වීම මත මෙම යෝජනාව ඉදිරි මාසය තුලම ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී.

**07. 279 තුලානයේ ඉච්චන්කුලම තෙන්නකෝන් මහතාගේ ගව පට්ටිය ඉදිරිපිට මාර්ගයට බොරළු පස් දැමීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මාතලේ පාර, ඉච්චන්කුලම, අනුරාධපුර ලිපිනයේ පිහිටි පාරමිතා ධර්මායතනය විසින් ඉච්චන්කුලම (279 තුලානය) තෙන්නකෝන් මහත්මයාගේ ගව පට්ටිය ඉදිරිපිට මාර්ගයට බොරළු පස් අතුරා සංවර්ධන කර දෙන ලෙස කර ඇති ඉල්ලීම මහ සභාවට ඉදිරිපත් කරමින් මේ සඳහා අවශ්‍ය බොරළු පස් සපයා අදාල මාර්ගය අළුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා අදාල මාර්ගය ඉදි කිරීම වෙනුවෙන් බොරළු ලෝඩ් 05 ක් සපයා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසු අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ඉදිරිපත් කල යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**08. කඳවුර වෙත පිවිසෙන ප්‍රධාන මාර්ගය නම් කර ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අනුරාධපුර ගල්කුලම දක්වා වූ ප්‍රධාන මාර්ගයේ කවරක්කුලම ප්‍රදේශයේ පිහිටා ඇති Armoured Corps Training Center පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කර දශක 03 කට අධික කාලයක් වන බැවින් ඒ තුල යුධ හමුදා නිළධාරීන් හා සෙසුනිලයන් මෙන්ම විවිධ රාජ්‍ය ආයතනයන්හි රාජකාරි කරනු ලබන රාජ්‍ය නිළධාරීන් හා නිළධාරිනියන් විශාල ප්‍රමාණයක් හට පුහුණුව ලබා දී ඇති බවත්, මෙහි මේ දක්වා ආයතන ප්‍රධානීන් වශයෙන් ශ්‍රී ලංකා සන්නාහ හා සන්නද්ධ බලකායට අයත්, කර්නල් , ලුතිනන් කර්නල්, මේජර් නිලයේ ජ්‍යේෂ්ඨ නිළධාරීන් 27 දෙනෙකු පමණ සේනාවිධායක තනතුරු හොබවා ඇති අතර මෙහි පළමු සේනාවිධායක වශයෙන් පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් රාජකාරි සිදු කර ඇති මේජර් ජ්නරාල් පී.ජී කරුණාතිලක නිළධාරි තුමන් කල සේවාව වෙනුවෙන් ගෞරවය දැක්වීම උදෙසා එතුමාගේ නාමය මෙම කඳවුර වෙත පිවිසෙන ප්‍රධාන මාර්ගය සඳහා ගෞරව නාමයක් ලෙස යෝදා එම මාර්ගය නම් කර ගැනීමට ඉල්ලා ඇති බැවින් එම මාර්ගය එලෙස නම් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් එම මාර්ගය නම් කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**09. 246 වන්නියම්කුලම විවේකාරාම පන්සල් ගොඩනැගිල්ල වෙන් කිරීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 246 වන්නියම්කුලම විවේකාරාම පන්සල් ගොඩනැගිල්ල වෙන් කිරීමට අදාල රු172,837.00 ක ඇස්තමේන්තුව මහ සභාවට ඉදිරිපත් කරමින්, එම ඇස්තමේන්තුව ප්‍රකාරව කොන්ත්‍රාත් පදනමින් අදාල ඉදි කිරීම සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය රජරට නවෝදය 247 තුලානයේ ග්‍රාම සේවක නිළධාරීතුමා ඇතුළු රජයේ නිළධාරීන් රැඳී සිටීම වෙනුවෙන් සකස් කලත්, පන්සලේ ස්වාමීන්වහන්සේ එය පෞද්ගලිකව අත්පත් කර ගෙන සිටින බවත්, මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තු මා සමඟ සිදු කල සාකච්ඡාවකින් අනතුරුව එම ගොඩනැගිල්ල බිත්තියකින් වෙන් කර වෙනම ගේට්ටුවක් දමා සකස් කර ගැනීමට අවස්ථාව සලසා දී ඇති බැවින් ඉදිරිපත් කල ඇස්තමේන්තුව ප්‍රකාරව කොන්ත්‍රාත් පදනමින් අදාල ඉදි කිරීම සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**10. කාර්ය සාධන අරමුදල් මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (PPTA)**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා කාර්ය සාධන අරමුදල් මගින් ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් හඳුන්වා දෙන නිර්ණායකයන් අතරින් ප්‍රාදේශිය සභාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත යෝජනා මහ සභාවට ඉදිරිපත් කරමින් අදාල යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| අනු අංකය | ව්‍යාපෘතිය | දළ ඇස්තමේන්තුව |
|---|---|---|
| 01 | මාර්ග නඩත්තු හා අළුත්වැඩියා වැඩහල් (උපකරණ සහිත වැඩ ඒකක) ස්ථාපනය කිරීම | 10,000,000.00 |
| 02 | පාසල් අධ්‍යාපන අවශ්‍යතාව සපුරාලීම පිණිස අධ්‍යාපන පොත් මිල දී ගැනීම | 333,333.33 |
| 03 | අපද්‍රව්‍ය රැස් කිරීම, සේවා වැඩිදියුණු කිරීම (කසල බඳුන් ලබා දීම) | 500,000.00 |
| 04 | පළාත් පාලන ආයතන වල ආබාධිත අය වෙනුවෙන් ප්‍රවේශ පහසුකම් සැපයීම | 500,000.00 |
| 05 | අර්ධ වශයෙන් ඉදිකළ මාර්ග හා කාණු පද්ධති සම්පූර්ණ කිරීම | 5,500,000.00 |
| 06 | ළමා හා මාතෘ සත්කාර මධ්‍යස්ථාන වල ( පුටු හා සනීපාරක්ෂක ) පහසුකම් ඉහල නැංවීම | 600,000.00 |
| 07 | පළාත් පාලන ආයතනයට අයත් සේවා ස්ථාන සඳහා පුනර්ජනනීය බල ශක්ති (සූර්ය බල ශක්තිය) විසඳුම් හඳුන්වා දීම | 2,050,000.00 |
| 08 | පළාත් පාලන ආයතනයට අයත් සේවා ස්ථාන හා ආපදා කළමණාකරණය සඳහා විදුලි ජනන යන්ත්‍රය මිල දී ගැනීම | 1,900,000.00 |

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා ඉදිරිපත් කල යෝජනා අදාල ව්‍යාපෘතිය හරහා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් හිමි වන කාර්ය සාධන අරමුදල් මගින් ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2021 ඔක්තෝම්බර් මස 08 වන දින මුදල් කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2021 සැප්තැම්බර් මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021.11.16 වන දින පළාත් පාලන නීතිය සම්බන්ධයෙන් පුහුණු වැඩමුළුව පෙ.ව 9.00 සිට සවස 4.00 දක්වා මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශිය සභා ගරු සභික මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් මෙම ප්‍රාදේශීය සභා භූමියේ පැවැත්වෙන බැවින් එදිනට සියළුම ගරු සභිකවරුන් සහභාගී වන ලෙස ඉල්ලා සිටින ලදී.

ගරු මන්ත්‍රී පී කරුණාරත්න මැතිතුමා ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන -2021 යටතේ මෙම පළාත් පාලන ආයතනයට අදාලව ව්‍යාපෘති ඉටු කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබූ ව්‍යාපෘති කිහිපයක් සංශෝධනය කර දෙන

ලෙස ඉල්ලා සිටී බැවින්, ඒ පිළිබඳ වර්ථමාන තත්වය කුමක්ද යන්නත්. මහජනතාවගේ ඉල්ලීම් ගරු මන්ත්‍රීවරුන් හරහා ඉටු කිරීම යටතේ තමන් ශබ්ධ වාහිනි යන්ත්‍ර ඉල්ලුම් කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන්ද විමසන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාල සංශෝධන ඉල්ලුම් කිරීමේ ලිපිය මේ වන විට අදාල ආයතන වෙත යොමු කර පවතින බවත්, ශබ්ධ වාහිනි මිල දී ගැනීම සඳහා වන මිල ගණන් මේ වන විට කැඳවා ඇති බවත්, සඳහන් කරන ලදී.

අනතුරුව ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා, බල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තුතිය ප්‍රකාශ කරමින් 2021.10.22 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 02.45 ට අවසන් කරන ලද අතර එළබෙන මහ සභාව 2021.11.23 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

| | |
|---|---|
| .................................... | .......................................... |
| බී.එච් ප්‍රදීප් නිශාන්ත, | එස්.බී කුමාරදාස, |
| ලේකම්, | සභාපති , |
| නැ.නු.ප ප්‍රාදේශීය සභාව, | නැ.නු.ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |